වෙනස් මානයකින් ලොව දකින්නට


# වෙනස

දේශපාලන හා ශාස්ත්‍රීය සංග්‍රහය


01 කාණ්ඩය
03 කලාපය
2017 ඔක්තෝබර් - නොවැම්බර්
පිටු 60 මිල රු.100.00



## සැබෑ වන සිහිනයක මහිමය



අපි අපේ දරුවන් පණ සේ සුරකිමු



කුඹුරු ඉඩම්: බත් පතෙන් ඔබ්බට ගිය කතාවක්



තිරසර සංවර්ධනය සහ ග්‍රාමීය සංවර්ධන අභියෝග

# වෙනස

දේශපාලන සහ ශාස්ත්‍රීය සංග්‍රහය

ප්‍රධාන සංස්කාරක
**තුෂාල් විතානගේ**

සම්බන්ධීකරණ සංස්කාරක
**සුජීව සෙනරත්**

නියෝජ්‍ය සංස්කාරක
**ලක්ෂ්මන් සිරිවර්ධන**

සංස්කරණ සහාය
**නුරාණි තෙන්නකෝන්**

ප්‍රකාශන කළමනාකරණය
**චතුරී සමරවීර**

නිර්මාණයකරණය
**තුෂාර වල්ගම**

ප්‍රකාශනය සහ බෙදා හැරීම

**සසවි ප්‍රකාශකයෝ,**
**බී. 81, පර්ත් පැරඩයිස්,**
**ගුරුගොඩ, හොරණ.**
**070 2080 413**

**මුද්‍රණය**
සී. ආර්. ප්‍රින්ට් හවුස්
11 ඒ, සුදේරිස් සිල්වා මාවත, හොරණ.
034 2266342


'වෙනස' සඟරාව පුරවැසි සඟරාවක්. එනිසා පුරවැසි ඔබට මෙය ශක්තිමත් වේදිකාවක් වශයෙන් භාවිත කළ හැකියි. දේශපාලන, ආර්ථික, සංසකෘතික, ශාස්ත්‍රීය ආදී සියලු නැඹුරුම් සහ හරවත් ලිපි අප වෙත යොමු කරන්න.
ඔබ වෙනුවෙන් ශක්තිමත් මතවාදී වේදිකාවක් නිර්මාණය කරන්න අපි සූදානම්.

ප්‍රධාන සංස්කාරක

## ඇතුළත පිටු


අපි අපේ දරුවන් පණ සේ සුරකිමු

03-08

සැබෑ වන සිහිනයක මහිමය

09-11

දෙයක් වේ නම් යම් සුදුසුස්ටම අයිති විය යුතු

12-14

කුඹුරු ඉඩම්: බත්පතෙන් ඔබ්බට ගිය කතාවක්

15 -19

වස විස නැති ගොවිතැනට මිතුරු තුරු

20 -22

වකුගඩු රෝගයෙන් මෙරට ජනයා මුදාගැනීම සඳහා කටයුතු කිරීම අප සැමගේ යුතුකමක් මෙන්ම ප්‍රධාන වගකීමක්

23 - 28

වකුගඩු මාරයාට එරෙහි සටන: ඊයේ අද සහ හෙට

29 - 32

මොරගහකන්ද දියවර සේ ගලම් මම

33 -37

ගබ්සාව සහ ලංකාවේ නීතිය

38 - 41

තිරසර සංවර්ධනය සහ ග්‍රාමීය සංවර්ධන අභියෝග

42 - 46

ජාතික සංහිඳියාවට මෛත්‍රී ප්‍රවේශයක්

47 - 51

රාජ්‍ය ආයතන කාර්යක්ෂම නම් පුද්ගලීකරණය හෝ ප්‍රතිව්‍යුහගතකරණය අවශ්‍ය වන්නේ නැහැ

52 - 53

ගැමි දිවිය නංවන 'ජනපති පුරවැසි අත්වැල'

54

ජාතික ආහාර නිෂ්පාද සංග්‍රාමය

55- 60



# සැබෑ වන සිහිනයක මහිමය



අපි මේ පළාතට මුල් වරට ආවේ නවසිය තිස් ගණන්වල, මමයි, ඩඩ්ලි සේනනායක මහත්තයයි අවේ තිරික්කලයකින්. ඒ තිරික්කය මැදිරිගිරයෙ ඒකනායක මන්ත්‍රීතුමාගේ තාත්තගේ. ඒ අය මේ පළාතට ඇවිත් තියෙන්නේ අට වැනි සියවසේ. අපි මෙතන් ඉඳලා අංගම්මැඩිල්ලට ගියා. සවස හයට විතර සොරබොර වැවේ නෑවා. අපි ආවේ ගොවි ජනපද බලන්න. එදා හිමිය කවුරු හරි මෙතන ඉන්නවාද ? මට පෙන්නේ නැහැ වගෙයි''

හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා මේ ප්‍රකාශය කළේ එවකට පැවැති මහියංගන ගම්උදා සංවත්සරය අමතමිනි. මේ කතාවට දැන් දශක තුනකට වැඩි කාලයක් ගතව තිබේ. ජයවර්ධන ජනාධිපතිවරයා එම සිහිපත් කිරීම කළේ මේ රටේ ගොවි ජනපද ව්‍යාපාරයේ මුල් අදියරේ ක්‍රියාකාරකම් සිහිපත් කරමිනි.

''ජනපතිවරයා මැදිහත් වී සිටින්නේ පසුගිය ආණ්ඩු ගණනාවකින් සිදු වූ වරද නිවැරදි කරමින් ගොවි බිමක හිමිකම එහි ජීවත් වන රට වෙනුවෙන් ඓතිහාසික කාර්යභාරයක් ඉටුකළ ජනපදික ගොවිජනතාවට ලබාදීමමය. එය අධිරාජ්‍යවාදී යුගයේ සිටම මේ රටේ ගොවි ජනපද පිහිටු වීමේ ක්‍රියාදාමයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙසින් ඉතිහාසයේ සටහන් වනු ඇත''

අපේ රටේ ගොවි ජනපද ව්‍යාපාරය ඇරඹුණේ නවසිය තිස් ගණන්වල අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කළ සමයේදී ය. එහි පුරෝගාමී මැඩ කොටස ඉටු වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ඩී.එස්. සේනානායකයන් අතිනි. එවකට ඔහු නිදහසට පෙර පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම ඇමැතිවරයා ලෙස කටයුතු කර තිබුණි.

ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක්ව පැවැති සමයේ විනාශ වූ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කර යළි රජරට හා ඌවේ කෘෂිකාර්මික නවෝදය ඇති

කුරලීමේ පුරෝගාමී කාර්යයට එදා ඩී.එස්. සේනානායක අතගසා තිබුණි. එය නිදහසට පෙරම ඇරඹියේ අධිරාජ්‍යවාදීන් අතින් වූ වැරදි ඔවුන්ගේම පාලනය තුළින්ම නිවැරදි කිරීමට දැයි දන්නේ නැත. කෙසේ නමුත් ඩී.එස්. නව ගොවි ජනපද ඇති කරමින්, ඉඩම් බෙදා දෙමින්, ඒවායේ ජනතාව පදිංචිකරවමින් ගෙන ගිය විප්ලවය අදත් මේ රටේ ජනතාව සදා අනුස්මරණීයව සිහිපත් කරති.

''අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා තමයි මේ රටේ මහා ගොවි ජනපද ව්‍යාපාරය පටන් ගත්තේ. අනුරාධපුරය, පොළොන්නරුව, මොනරාගල, දිගාමඩුල්ල, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල එදා මහා ගොවි ජනපද ආරම්භ කිරීම මේ රටේ ගොවි ජනපද ශිෂ්ටාචාරයක් සංස්කෘතියක් වගේම ජාතික ආර්ථිකය ශක්තිමත් කරන පුළුල් පදනමක් ඇති කෘෂි ආර්ථිකයක් ආරම්භ කිරීම සඳහා මූලික පදනමක් හා අඩිතාලමක් ඒ තුළ ඇති වුණා'' (ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, 2017/08/18, මාධ්‍ය)

රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ සිටම බලයට පත් සෑම රජයක්ම වාගේ අඩු වැඩි වශයෙන් මේ ගොවි ජනපද ක්‍රමය ශක්තිමත් කරලීමේ හා ඊට උදව් උපකාර මෙන්ම නවත් එය වැඩි දියුණු කිරීමේ කාර්යයක නිරත විය. ඊට හේතුව කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ජනතාවට බත සැපයීමේ මූලික කාර්යය වෙනුවෙන් මෙන්ම සහලින් ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවක් උදා කිරීම වෙනුවෙන් ගොවි ජනපද මූලික වී ක්‍රියා කිරීමයි. එසේම සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමෙහි ලා ගොවි ජනපද පුරෝගාමී මෙහෙවරක නිරත වීමයි. එදා ඩී.එස්. ඇරඹි මේ රටේ ගොවි ජනපද ව්‍යාපාරය නගාසිටුවීමේ හා වැඩි දියුණු කිරීමේ පුරෝගාමී මෙහෙවර ඉටු වූයේ මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගිනි. මහවැලිය ගොවි ජනපද අංගනාවට පැළඳූ වැඩි වටිනාකමකින් යුතු පළඳනාවක් වැනිය. එය ගොවි ජනපදවලට ජලය සැපයීමේ පමණක් නොව නව ගොවි ජනපද හා ගොවිබිම් බිහි කිරීමේ දැවැන්ත කෘෂිකාර්මික ව්‍යාපාරය බවට පත්විය.

මේ රටේ මහවැලි ව්‍යාපාරය පිළිබඳ ඓතිහාසික කථිකාවත ඇරඹෙන්නේ 1930 ගණන්වල සිටය. නැතිනම් ගොවි ජනපදවල ආරම්භයත් සමගිනි. එහෙත් එය දැවැන්ත බහුකාර්ය වාරි යෝජනා ක්‍රමයක් ලෙසින් ඇරඹෙන්නේ 1965-70 ඩඩ්ලි සේනානායක අගමැතිවරයාගේ රාජ්‍ය සමයේදී ය. ඒ 1969 දී සී.පී. ද සිල්වා ඇමැතිවරයා 1969 මහනුවර පොල්ගොල්ලෙන් මහවැලි ගඟ හරස් කර ජලය උතුරට හැරවීමේ වේල්ලට මුල්ගල නැබීමත් සමගය.

1970 ආණ්ඩු පෙරළියත් සමග රජරට නායක වූ සමගි පෙරමුණු රජයේ වාරිමාර්ග විෂය භාර අමාත්‍ය මෛත්‍රීපාල සේනානායක මහතා යටතේ මහවැලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණි. ඒ අනුව 1976 ජනවාරි 08 වැනිදා පොල්ගොල්ලෙන් රජරටට ජලය මුදා හරිනු ලැබීය. මහවැලි ජලය බහුකාර්යය යෝජනා ක්‍රමයක් යටතේ පොල්ගොල්ලෙන් රජරටට ගලා ගියේ මෙතැන් සිටය.

1977 එක්සත් ජාතික පක්ෂ රජය යටතේ වසර 30කින් නිමවීමට තිබූ මහවැලි යෝජනා ක්‍රමය වසර හයකින් නිම කිරීමේ තීන්දුවක් ගනු ලැබීය. එවකට මහවැලිය අයත් වූයේ ගාමිණී දිසානායක ඇමැතිවරයාගේ විෂයපථයටයි. මහවැලිය 'කඩිනම් මහවැලිය' බවට පත් වූයේ මෙතැන් සිටය. එය වික්ටෝරියා, රන්දෙනිගල, කොත්මලේ, රන්ටැඹේ හා මාදුරුඔය ජලාශ සමග රටේ කර්මාන්ත සංවර්ධනය සඳහා විදුලි උත්පාදන කටයුතු වෙනුවෙන් වැඩි බරක් තබා කටයුතු කළ බව පෙනේ. 1994 සිට බිහි වූ පොදුජන එක්සත් පෙරමුණු රජය මගින් මහවැලි ව්‍යාපාරයේ ඉදිරි කටයුතු ගොවි ජනපද ඉලක්ක කර ගනිමින් මෙහෙයවනු ලැබීය.

එහෙත් ගොවිබිම්වලටම වැඩි වශයෙන් ජලය ගලා යන ගොවි ජනපද ඉලක්ක කරගත් ව්‍යාපෘතිය වශයෙන් සැලකෙන්නේ 'මොරගහකන්ද - කළුගඟ ව්‍යාපාරය'යි. මහවැලි ව්‍යාපාරයේ විශාලතම ජලාශය ඉදිවන්නේ ද මෙම ව්‍යාපෘතිය යටතේය. එය පරාක්‍රම සමුද්‍රය මෙන් සිවු ගුණයකටත් වඩා විශාලය වනු ඇත. අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට පමණක් නොව වයඹ පළාතේ කොටසකට ද වාරි ජලය මෙන්ම පානීය ජලය ද මොරගහකන්ද - කළුගඟ ව්‍යාපාරය මගින් ලබාදීමට නියමිතය. මෙමගින් ගොවි ජනපදවල ජල හිඟය අවසන් වනු ඇත.

වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සිය දේශපාලන දිවියේ ආරම්භයේ සිටම මෙම ව්‍යාපෘතිය ඇරඹීම සඳහා සටන් කළ, උද්ඝෝෂණය කළ, මෙන්ම ආණ්ඩුවල අවධානයට ලක් කළ නායකයෙකි. එහෙත් ඒ පිළිබඳ සිහිනයට මුල්ගල තැබෙන්නේ 2007 ජනවාරි 25 වැනිදා ය. එතැන් විට 2012 දක්වා වසර පහක් බෙහෙවින්ම එය මුල්ගලට පමණක් සීමා වූ ව්‍යාපෘතියක් වුණි. එදා එම ප්‍රමාදය සිදු නොවිණි නම් රජරට වැව් 600ක් සමගින් උතුරු මැද, වයඹ පළාත්වලට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ද 2012 සිටම ජලය ලබාදීමේ හැකියාව තිබුණි. එසේ වූවානම් වර්තමානයේ පවතින නියඟයට ද විසඳුමක් ලැබෙනු ඇත.

නැවත මොරගහකන්ද ව්‍යාපාරය සක්‍රිය වීමට පටන් ගනු ලැබුවේ 2015 ජනවාරි 08 වැනිදා ඇරඹි නව පාලනය මගය. මේ වන විට වැඩ අවසන් වෙමින් පවතින මොරගහකන්ද - කළුගඟ ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉදිවන මහා ජලාශය ජලයෙන් පිරී යමින් පවතී. එමගින් නිකුත් වන ජලධාරා සමගින් පවතින නියංසායට පිළිතුරක් ලැබෙනු ඇත. එය ගොවිජනතාවගේ ප්‍රීති ප්‍රමෝදයට හේතු වන බව අමුතුවෙන් කිව යුතු නැත.

එහෙත් එම ප්‍රීතියේ ද අඩුවක් පවතී. වත්මන් රජය බලයට පත් වූ දා සිටම ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා මහවැලි අමාත්‍යාංශය තමා යටතට ගනිමින් ගත් එක් උත්සාහයක් වූයේ එම ප්‍රීතියේ අඩුව සම්පූර්ණ කරදීමටය. එනම් තාවකාලික බලපත්‍ර වෙනුවට මහවැලි ජනපදිකයින්ට ස්ථිර ඔප්පු ලබාදීමටය.

ඔප්පුවක් නොමැතිකමින් වසර තිස් හතළිස් ගණනක් මහවැලි ජනපදිකයින් විඳි දුක් ගැහැට අපමණය. ඒ වෙනුවට දූෂිත නිලධාරීන්ට දොළ පිදේනි දීමට ද ඔවුන්ට සිදුවිය. සමහර ජනපදිකයින් මහවැලි වතුරින් සිය කෙත් වතු සරු කර ගන්නා නමුදු ජනපදවල වාසයට පැමිණ වසර 60 - 70 ක් පමණ වේ යැයි සැලකේ.

මේ දිනවල ජනපති නියමයෙන් කඩිනමින් සැකසෙන්නේ ඔවුන්ට හිමි එම සින්නක්කර ඔප්පු බව පැහැදිලිය. ගොවි ජනපදවල ජීවත් වන ජනයාට දශක ගණනාවකින් පසු සින්නක්කර ඔප්පුවක හිමිකම ලැබීම රටක් රාජ්‍යයක් පහළ වූවාට සමානය. මේ නිසා හෙට දවසේ මොරගහකන්ද ජලාශය සමග මහවැලි ජනපදිකයනට ජනපති මෛත්‍රීගේ මැදිහත්වීමෙන් තමන්ට කියා සින්නක්කර ඔප්පුවක් ලැබේ.

මහවැලි මහ සැලසුමට අනුව පදිංචි කිරීමට නියමිත ගොවි පවුල් ගණන 141,000 කි. මහවැලියට අයත් කලාප 10ක වාරි ඉඩම් හෙක්ටයාර් 10,15, 226ක් ද, ගොඩ ඉඩම් හෙක්ටයාර් 2,63,474ක් ද අසැවැද්දීමට නියමිතය. මෙවර ඔප්පු පිරිනැමීමේ අපේක්ෂිත ඉලක්කය ඉඩම් ඔප්පු 100,000කි. ඒ අනුව මහවැලි ජනපදිකයින් පවුල් ලක්ෂයකට සින්නක්කර හිමිකම් සහිත ඔප්පු ලැබේ. මේ වන විට එම ඉලක්කයෙන් සියයට 85ක් සම්පූර්ණ කර ඇතැයි පැවසේ. මේ නිසා 2017 වසර අවසන් වන විට අදාළ ඉලක්කය නිම කිරීමේ අපහසුවක් දක්නට නොලැබේ. ඊට පූජනීය ස්ථානවලට අදාළ ඔප්පු 130ක් ද අයත් වේ.

දිනටමත් ජනපතිවරයා ප්‍රදේශ කිහිපයකට ම ගොස් සියතින්ම ඔප්පු පිරිනැමීමට සම්බන්ධ වී ඇත. ජනපදිකයනට තමන් ජීවත් වන ගොවි බිමේ අයිතිය බලපත්‍රයක් මගින් පමණක් තහවුරු වනවාට කිසිවෙක් කැමැති නැත. එය ඔවුන් සලකන්නේ සිය පාරම්පරික ගම්බිම් හැරදා හෝ ඒවා ජලයට යටකර පැමිණි තමන්ට කරන මදිපුංචිකමක් ලෙසිනි. මැතිවරණයක් ළඟ එන විට මේවා සම්බන්ධයෙන් සුන්දර කතා අසන්නට ලැබේ. එහෙත් හිමිකම් ඔප්පු ලැබෙන්නේ නැත. මේ නිසා කාර්යාල ගානේ රස්තියාදු වන ගොවිජනතාවට සමහර දූෂිත නිලධාරීන්ට අතයට මුදල් පවා ලබාදීමට සිදුවේ. එහෙත් ඒවායින් ද පළක් නොවන අවස්ථා ඇත.

ජනපතිවරයා මැදිහත් වී සිටින්නේ පසුගිය ආණ්ඩු ගණනාවකින් සිදු වූ වරද නිවැරදි කරමින් ගොවිබිමක හිමිකම එහි ජීවත් වන රට මෙනුමෙන් ඓතිහාසික කාර්යභාරයක් ඉටුකළ ජනපදික ගොවිජනතාවට ලබාදීමටය. එය අධිරාජ්‍යවාදී යුගයේ සිටම මේ රටේ ගොවි ජනපද පිහිටුවීමේ ක්‍රියාදාමයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙසින් ඉතිහාසයේ සටහන් වනු ඇත.

දිනමිණ පුවත්පත ඇසුරිනි

**- වසන්තප්‍රිය රාමනායක -**

ඡායාරූප: ජනාධිපති මාධ්‍ය ඒකකය



''**දෙයක්** වේනම් යම

සුදුස්සාමම අයිති විය යුතු''
අසඩක් නම් විනිසුරුවරයා
එහෙම කිවුවේ ළදරු මයිකල්
කුමාරයාගේ අයිතිය ඔහුව වැදූ
මව වන නටාලියා බිසව
වෙනුවට ඔහුව හදාවඩා ගත්
ගෲෂා නම් මෙහෙකාරියට පවරා
දෙමින්.


අපි කිවුරුත් මේ අදහසට එකඟයි. කැමැතියි. ඒත් ඒක සිද්ධ වෙන්නේ නම් හරිම අඩුවෙන්. එහෙම වෙන්න නම් එතැන හිමිකම කියන්න සැබෑ අයිතිය තිබෙන ගෲෂලා වාගේම අසඩක් වාගේ ප්‍රායෝගික මිනිස්සුත් ඉන්න ඕනෑ. මෙවැනි මිනිසුන්ගේ හිඟය නිසා තමයි අදත් බොහෝ දේවල්වලට නටාලියාලා අයිතිවාසිකම් කියන්නේ. ගෲෂලා තැන තැන හුහුල්ලන්නේ. දුක් විඳින්නේ.

මේ කතාව මතක් වුණේ පසුගිය දා මහවැලි එච් කලාපයේ සහ වලව කලාපයේ ගොවීන් 10,000කට සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීම නිමිත්තෙන් දිගන මධ්‍යම පළාත් ක්‍රීඩා සංකීර්ණයේදී පැවැති උත්සවයෙන් පසු ඔප්පු ලාභී ගොවිමහතුන්, ගෙවිලියන් සමග කළ කෙටි සම්මුඛ සාකච්ඡාවලින් පසුවයි. උත්සවයේ ප්‍රධාන අමුත්තා වුණේ මේ වැඩපිළිවෙළේ නිර්මාතෘ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා. එතුමන් අතින්ම ගොවීන්ට සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීම සිදු වුණා.

මේ අවස්ථාව අතිශය හැඟුම්බර එකක් වුණා. පරම්පරා ගණනාවක් තමන්ගේ ලේ, දහඩිය, කඳුළු මුසු කරමින් සරු සාර කළ භූමිය නීත්‍යානුකූලව තමන්ට හිමි නැති බව ඔවුන් සැබැවින්ම දැන සිටියා. ඔවුන් හිමියේ බලපත්‍රයකින් පමණක් පැවරූ හිමිකමක් අනැතිව පමණයි. ඒත් මෙහි ඇති වඩාත්ම සංවේදී කතාව තමයි මේ අති බහුතරයක් බලපත්‍ර හිමි ගොවීන් සැබැවින්ම ඉතාම සරු සාර අක්කර ගණනක ඉඩම්වලට හිමිකම් කී පුද්ගලයින් වීම. හත්මුතු පරම්පරවාම ජීවත් වූ උපන් බිම මහවැලියේ පංච මහා ජලාශවලට දන් දුන් පරිත්‍යාගශීලී මිනිසුන් වීම.

උපන් බිමෙන් මුල් උදුරා දැම්මා වාගේ ගොවි ජනපදවල පදිංචි වෙලා දහසකුත් එකක් දුක් කරදර උසුලමින් ඒ බිම සරු සාර කෙත්වතු බවට පත්කළ මේ සැබෑ මිනිසුන්ට යුක්තිය ඉටුවීමට මේ තරම් කාලයක් ගැනීම සැබැවින්ම කනගාටුවට කරුණක්.

''ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ මහවැලි ඉඩම්වලට ඔප්පු දෙනවා කියලා කිවුවා. ඒ වගේම අපිට අද ඒ ඔප්පු ලැබුණා. ඒ විශ්වාසය අපට ගොඩක් වටිනවා''



# "දෙයක් වේ නම් යම් සුදුසුස්සාටම අයිති විය යුතු"

ඒත් පමාවී හෝ යුක්තිය ඉටුවීම අපි බෙහෙවින් අගය කළ යුතුයි.

යළිත් කතාවේ මුලට. දිගනදී අපි දැක්කේ ඉඩම් ලැබීමට සුදුසුම පුද්ගලයින්ට ම ඒ ඉඩම්වල සැබෑ හිමිකම ලැබෙන ආකාරය. පරම්පරා ගණනාවකට පසුව මේ ආශ්චර්යය සිදු වුණේ කොහොමද ? ඒ අසඩක් වැනි ප්‍රායෝගික මිනිසෙක්, මිනිසුන්ගේ පැත්තෙන් සිතන පතන මිනිසෙක් රටේ මුල් පුටුවට හිමිකම් කීම නිසයි.

''මගේ වයස අවුරුදු 76යි. මගේ දෙමාපියොත් මේ ඉඩමේ හිටියේ. දැන් මමත් ඉන්නවා. මගේ දරුවොත් ඉන්නවා. ඉඩම පර්චස් තිහයි. එදා ඉඳන් අපිට හරි අයිතියක් නැහැ. ඉතිං, අපේ තාත්තට මට දෙන්න දේකුත් නෑ. මට මගේ දරුවන්ට දෙන්ට බිං අඟලක් නෑ.

අපි ඉතිං බදු ක්‍රමයට මේ ඉඩම්වල ජීවත් වුණා. ඒත් අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අද අපට පරම්පරා ගණනකින් නොලැබුණු ඉඩමේ නීත්‍යානුකූල අයිතිය දුන්නා. ගොඩක් සතුටුයි. ගොඩක් පින්. දැන් මට කොන්ද කෙලින් තියාගෙන දරුවෙකුට හරි යුතුකමක් ඉටු කරන්න පුළුවන්. ඒක මේ ජීවිතේම ලැබුණු ලොකුම සතුට''

මෙහෙම කියන්නේ සෙන්නයියා සුප්පයියා ගොවි මහතා. සෙන්නයියාගේ කතාව හරියටම හරි. තමන්ගේම කියලා බිම් අඟලකට හිමිකම් ලැබීම මොනතරම් සතුටක්ද ? අභිමානයක්ද ? දැන් සෙන්නයියලාට කොන්ද කෙලින් තියාගෙන ජීවත් වෙන්න පුළුවන්. ඒ තමන්ට කියලා තමන් උපන් රටේ බිම් අඟලක් තිබෙන නිසා.

මේ රටේ ගොවි ජනතාව තරම් දේශපාලනඥයින්ගේ රැවටීම්වලට ලක් වුණ වෙනත් ප්‍රජාවක් නැති තරම්. ඡන්ද කාලවලදී ඔවුන්ගේ වටිනා ඡන්දය තමන්ගේ පෙට්ටියට දා ගන්න දේශපාලනඥයෝ නොගන්න වෑයමක් නැහැ. නොදෙන පොරොන්දුවක් නැහැ. මේ පොරොන්දු කන්දක් දීලා බලය ලබාගත් පසු ඒ පොරොන්දු කවදාවත් ඉටු කරන්න යන්නේ නැහැ. බලය දිනා ගත් දා සිට සිදු වන්නේ ගොවිජනතාව කබලෙන් ලිපට දාන දේවල්. අයිත් ඡන්දයක් එනතුරු ඔවුන් උසුලන්නේ දුක් ගින්දරම පමණයි.

''මට මේ ඉඩම ලැබිලා අවුරුදු විසිපහක් වෙනවා. නමුත් මේ ඉඩමට නීත්‍යානුකූල අයිතියක් නැති නිසා අපි ගොඩක් දුක් වින්දා. ගෙවල් හදන්න ප්‍රාදේශීය සභාවෙන් අවසර දුන්නේ නැහැ. බැංකු ණයක් ගන්න බැහැ. අපි හරියට අනුන්ගේ ඉඩමක ඉන්නවා වාගේ තමා ජීවත් වුණේ. තමන්ගේ කියන හැඟීමකින් මේ ඉඩමක දෙයක් කරන්න බැහැ. මේ ඉඩම්වලට නීත්‍යානුකූල අයිතියක් අද දෙයි, හෙට දෙයි කියලා අපි කාලයක් බලන් හිටියා. දවසින් දවස ඒක පුස්සක් බවට පත් වුණා. ඡන්ද කාලවලදී නම් එක එක පොරොන්දු දුන්නා. අපි ඒ දිහා බලාගෙන උන්නා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ මහවැලි ඉඩම්වලට ඔප්පු දෙනවා කියලා කිවුවා. ඒ වුගේම අපිට අද ඒ ඔප්පු ලැබුණා. ඒ විශ්වාසය අපට ගොඩක් වටිනවා'' සරත් කුමාර මහතා තමන්ගේ ඉඩමේ ඔප්පුව පපුවට තුරුළුකර ගනිමින් කියවනවා.

''ඒ විශ්වාසය අපට වටිනවා'' සරත් කුමාර මහතා කියන්නේ දශක ගණනාවක් පුරා තමන් කොතරම් රැවටීම්වලට ලක් වුණා ද කියලා තිබෙන නීරස මතකය අවධි කරමින්.

ටී.එම්. විනීතා මහත්මිය මහවැලියේ නිලධාරිනියක්. ඇයට හිමිවන්නේ මහවැලි



''අද අපේ සිහිනය සැබෑ කරමින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අපිට නීත්‍යානුකූල ඔප්පු ලබා දුන්නා. අද අපට ඒ අයිතිය ලැබුණා. අපිට ගොඩාක් සතුටුයි''

සේවකයින්ම ලැබෙන ඉඩම් ෂංගුවක්. ඒත් ඇයට කියාත් වෙනසක් නැහැ. ලැබුණේ වාර්ෂික බලපත්‍රයක්. ඒ නිසා වින්ද දුක් කරදර නිමක් නැති බවයි විනීතා මහත්මියත් කියන්නේ.

''අපිට මේ ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අද ලැබෙයි, හෙට ලැබෙයි කියලා අවුරුදු ගානක් බලාගෙන හිටියා. රාජ්‍ය නායකයින් කිහිප දෙනකු යටතේම අපි සිහින මැවුවා. නමුත් අද දක්වාම ඒක සිහිනයක් පමණක් වෙලා තිබුණා. ඒත් අද අපේ සිහිනය සැබෑ කරමින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අපිට නීත්‍යානුකූල ඔප්පු ලබා දුන්නා. අද අපට ඒ අයිතිය ලැබුණා. අපිට ගොඩාක් සතුටුයි. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා මෙ වාගේ ප්‍රශ්න දිහා උපේක්ෂාවෙන් බලා කටයුතු කිරීම ගැන. අපිට අද සතුටුයි වාගේම ආඩම්බරයි'' විනීතා මහත්මිය වැඩි දුරටත් කියනවා.

මෙ අවුරුදු ගණනාවක් දුක්ක ගීනයක් සැබෑ වුණ විට කියන කතාවකින් ඔබ්බට ගිය මානුෂීය කතාවක්. රාජ්‍ය පාලකයින්ගේ සැබෑ ක්‍රියාකාරීත්වය ජනතාවට කොතරම් වැදගත් ද කියන එක ගැන ප්‍රායෝගික උදාහරණයක්. රාජ්‍ය නායකයින් කිහිප දෙනකුම යටතේ දුක්ක සිහිනය ඉටු වූ පසු ඇයට ඇතිවෙන්නේ ආඩම්බරයක්. ඒ උපන් බිමේ නීත්‍යානුකූල අයිතිකාරියක් වීම නිසා ඇති වන ආඩම්බරය ඉක්මවා ගිය එකක්.

එම්.ඩබ්ලිව්. පෙරේරා මහත්තයා ව්‍යාපාරිකයෙක්. නිතර නිතර මූල්‍ය අවශ්‍යතා නිදින් දුනෙන පුද්ගලයෙක්. ඒත් බිම් අඟලකට හිමිකම නැති ඔහු බැංකුවකින් ණයක් ගන්න ගිය විට මොනා තරම් අසීරුතාවන්ම මුහුණපාන්න ඇතිද ?

''මම ඉඩම ලැබුණේ කුඩා ව්‍යාපාරයක් සඳහායි. ඉඩම පර්චස් හයයි. 1999 අවුරුද්දේ ඉඳන් මේ දක්වා අපිට මේ ඉඩමට නීත්‍යානුකූල අයිතියක් තිබුණේ නැහැ. ඒ නිසා ව්‍යාපාරය පවත්වා ගෙන යද්දී නොයෙකුත් ගැටලු ඇති වුණා. ව්‍යාපාර අතින් අපි බින්දුවටම වැටුණා. ඉඩමේ කරන කිසිම දේකට අවසර ගන්න බැරිව ගියා. බැංකුවකින් ණයක් ගන්න විදිහක් නැහැ. අපි ව්‍යාපාර කරන්නේ බැංකුවලින් ණය අරගෙන. එහෙම දේකටවත් මේ ඉඩම ඇපයක් හැටියට තියන්න පුළුවන් වුණේ නැහැ. අවුරුදු 18කට පස්සෙයි අපිට ඉඩමට ඔප්පු ලැබුණේ. ඒ ගැන තියෙන්නේ ලොකු සතුටක්. දැන් ඉතිං කිසිම බයක් සැකක් නැතිව දරුවෙකුටවත් මේක දියුණු කර ගන්න පුළුවන්. දෙමාපියෝ හැටියට අපිටත් ලොකු සැනීමක් තියෙන්නේ'' පෙරේරා මහත්තයා කියනවා.

පී. චන්ද්‍රලේඛා මහත්මියට මහවැලියෙන් පර්චස් 20ක් දීලා තියෙන්නේ ඇයගේ ඉඩම මහවැලියට යට වුණ නිසා. ඒ 1999දී. ඉඩම ලැබුණ ගමන් චන්ද්‍රලේඛා මහත්මියට ලොකු නැහැ. ඒක විශාල ගැටලුවක් වුණා.

''ඉඩමට ඔප්පුවක් නැති එක ඇත්තටම ලොකු ප්‍රශ්නයක් වුණා. කිසිම දෙයක් හරියට කරන්න බැහැ. බයයි. ළමයි ලොකු මහත් වෙන කොට මේ ප්‍රශ්නේ නිදින්ම දුනෙන් පටන් ගත්තා. අපි හිතුවා මේ ප්‍රශ්නේ අද විසඳෙයි, හෙට විසඳෙයි කියලා. එහෙම අවුරුදු 18ක් විතර බලාගෙන හිටියා. අපි අන්තිමට මේ ගැන ආසාව හිතින් අත්ඇරලයි හිටියේ. ඒත් ජනාධිපතිතුමා අපට බලාපොරොත්තු ඇති කළා. අපිට ආරංචි වුණා එතුමා මේ ඉඩම්වලට සින්නක්කර ඔප්පු ලබා දීමට තීන්දු කළා කියලා. අද අපේ ඒ හීනය හැබෑ වෙලා. අපිට අවුරුදු 18කට පස්සේ අපේම කියලා මේ පොළොවේ බිම් අඟලක් හිමි වෙනවා. මේක ලොකු දෙයක්. පිනක්. මේ ගැන කියන්න මට වචන නැහැ''

චන්ද්‍රලේඛා මහත්මිය, විනීතා මහත්මිය, පෙරේරා මහතා වාගේ දහස් ගණනක් අපට එදා හමුවුණා. ඔවුන් සියලු දෙනාම එකහඬින් කියා සිටියේ අවුරුදු ගණනක් පුරා උපන් බිමේ නීත්‍යානුකූල බිම් අඟලක අයිතියක් නොතිබුණු තමන්ට සින්නක්කර ඔප්පු මගින් ජීවත් වූ බිමේ අයිතිය ලබාදීම මහත් පුන්‍යකර්මයක් බවයි.

සටහන
තුෂාල් විතානගේ

ඡායාරූප: ජනාධිපති මාධ්‍ය ඒකකය





# වකුගඩු රෝගයෙන් මෙරට ජනයා මුදාගැනීම සඳහා කටයුතු කිරීම අප සැමගේ යුතුකමක් මෙන්ම වගකීමක්



"රටේ ජීවනාලිය බඳු ගොවි ජනතාව මුහුණපා සිටින වකුගඩු රෝග උවදුර මැඩපැවැත්වීම පිණිස ජාතික වැඩපිළිවෙළක් දියත් කිරීමට මා පියවර ගෙන තිබෙනවා"

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන


## අසේල ඉද්දවෙල

වයාපෘති අධ්‍යක්ෂ

වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය


අතිගරු ජනාධිපතිතුමාගේ "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි සැමට සුබසෙත ජනිත කරවන නිරෝගී සමාජයක් බිහි කිරීමේ අරමුණින් මෙරට ජනයා දැඩි ලෙස පෙළෙන ගැටලු රැසක් විසඳීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළ රාශියක් ගෙන හැර ඇක්වයි. මේ අතර "වකුගඩු රෝග නිවාරණ වැඩසටහන"ම හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

1990 දශකයේ මුල්වරට මූලික වශයෙන්ම රජරට ප්‍රදේශයෙන් හඳුනාගත් මෙම වකුගඩු රෝගය මේ වන විට ලංකාවේ දිස්ත්‍රික්ක 11ක පමණ ව්‍යාප්ත වී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් වකුගඩු රෝගයෙන් මේ වන විට මිය ගොස් ඇති සංඛ්‍යාව 22,000ක් පමණ බව වාර්තා වී ඇත. කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි පාර්ශ්වයට වැළඳෙන මෙම රෝගය හේතුවෙන් මෙරට ජීවනාලිය බඳු ගොවි ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව තිබේ. පිරිමි පාර්ශ්වය වැඩි වශයෙන් මෙම රෝගයට ගොදුරු වන බව හඳුනා ගත්තද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්තා අනුව කාන්තාවන්ට මෙන්ම ළමුන්ට ද දැන් දැන් මෙම රෝගය වැළඳී ඇති බව වාර්තා වීම රටේ අනාගතය සම්බන්ධයෙන් සලකා බලන කළ ප්‍රබල අභියෝගයකි.

මෙම අභියෝගාත්මක තත්ත්වය මනාව වටහා ගෙන මනා දක්ෂකින් යුතුව වඩාත් කාර්යක්ෂමව මේ සඳහා අවතීර්ණ වෙමින් අතිගරු ජනාධිපතිතුමා විසින් මෙම රෝගයෙන් මෙරට මහජනයා මුදා ගැනීම සඳහා ඊට සම්බන්ධ විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් ඊට ප්‍රතිකර්ම යොදමින් මෙම අභියෝගය ජය ගැනීම සඳහා "වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය" පිහිටුවන ලදී.

## දැක්ම

වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකායේ දැක්ම වශයෙන් "නිදන්ගත වකුගඩු රෝගය නව දුරටත් වැළැක්වීම හා වකුගඩු රෝගීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධනය" හඳුනා ගෙන ඇත.

## මෙහෙවර

මෙහි මෙහෙවර වන්නේ, "දැනුම නතුකර ගැනීම හා හුවමාරු කිරීම, නිරවද්‍ය ක්‍රමවේදයන් යොදා ගැනීම, රෝග වැළැක්වීම හා ප්‍රතිකාර ලබාදීම සහ පීඩාවට පත්වූවන්ගේ සුබසාධනය, සම්බන්ධීකරණ ක්‍රියාදාමයක් මගින් සහතික වීම" යන්නයි.

## ප්‍රධාන කාර්යයන්

වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකා මගින් අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් හයකි (6).

1. වකුගඩු රෝග නිවාරණයට අදාළ ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.
2. වකුගඩු රෝග නිවාරණයට අදාළව අමාත්‍යාංශ, අධිකාරි, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය අංශයේ ආයතන අතර මනා සම්බන්ධීකරණය
3. නීතිමය හා ප්‍රතිපත්ති කාරණා සම්බන්ධව අවශ්‍ය සහයෝගී මැදිහත්වීම.
4. පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කිරීම.
5. සුපරීක්ෂණය හා අධීක්ෂණය.
6. පසු විපරම් කටයුතු සිදු කිරීම හා ප්‍රගති සමාලෝචනය.

## සම්බන්ධීකරණය සිදුකරන ආයතන

සෞඛ්‍ය අමාත්‍යාංශය, නගර සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සමාජ සවිබලගැන්වීම් සහ සුබසාධන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, සියලුම පළාත් සභා කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන. අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ණ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය මගින් වකුගඩු රෝගයෙන් දැඩි ලෙස බලපෑමට ලක්ව ඇති මෙරට ජනයා මුදා ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින්, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කරමින් කටයුතු රැසක් සිදුකර ගෙන යමින් සිටී. විශේෂයෙන් වකුගඩු රෝග නිවාරණය සඳහා ඉහත සඳහන් ආයතන සමග සම්බන්ධ වී පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ වැඩසටහන් සිදුකරමින් පවතී.

## ප්‍රමුඛ ක්ෂේත්‍ර

1. රෝග නිවාරණය සඳහා චර්යා ප්‍රවර්ධනය.
2. රෝගීන් පෙර හඳුනා ගැනීමේ ක්‍රියාවලිය.
3. රෝගීන්ට ප්‍රතිකාර කිරීම.
4. රෝගයා, පවුල සහ ප්‍රජාව සඳහා සුබසාධනය.
5. පිරිසිදු පානීය ජල සම්පාදනය.
6. සෞඛ්‍යාරක්ෂිත. ආහාර හා පෝෂණය.
7. සක්‍රීය නිරීක්ෂණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.
8. සමීක්ෂණ, පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්පාදනය.

## 1. රෝග නිවාරණය සඳහා චර්යා ප්‍රවර්ධනය

ඕනෑම රෝගයකින් වැළකීම සඳහා අදාළ රෝගය පිළිබඳ දැනුවත්වීම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින්, වකුගඩු රෝගය වැළඳීමට හේතු මොනවාද ? ඉන් වැළකී සිටිය හැක්කේ කෙසේද ? රෝගයෙන් වැළකීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද ? ආදී ලෙස මහජනයා රෝගයට ගොදුරු වීම වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම මෙහිදී සිදු කෙරේ. මෙහිදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙන්ම විවිධ සම්මන්ත්‍රණ, දේශන හා වැඩමුළු පවත්වමින් මහජනයා හා පාසල් සිසුන් දැනුවත් කිරීම සිදු කෙරේ. විශේෂයෙන් 2016 වසරේදී දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන්වලට සමගාමීව පාසල් ළමුන් සහ මහජනතාව දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. මේ සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛ දායකත්වයක් ලබා දෙන ලදී. එමෙන්ම වකුගඩු රෝග නිවාරණ

වැඩසටහනේ පාර්ශ්වකරුවන් වන අනෙකුත් විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන බොහොමයක දායකත්වය ද ලැබිණ.

## 2. රෝගීන් පෙර හඳුනා ගැනීමේ ක්‍රියාවලිය

රෝගය වැළැක්වීම සඳහාත්, රෝගයම ගොදුරු වීමේ අවකාශය මගහැරවීම සඳහාත් රෝගය වැළඳී ඇත්දැයි හඳුනා ගැනීම අත්‍යවශ්‍ය සාධකයකි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත්වීම මත රෝගීන් හඳුනා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ යටතේ රෝගය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශවල ජනයා රෝගය හඳුනා ගැනීමේ සායනවලට සහභාගී කරවා ගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉලක්කය වන අතර, ඊට අමතරව කාර්ය සාධන බළකා මගින් පවත්වනු ලබන වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන්වලට සමගාමීව ඒ ඒ ප්‍රදේශයන්ගේ අවශ්‍යතාවන්ට අනුව කඩිනම් ව්‍යාපෘති ලෙස ද හඳුනා ගැනීමේ සායන පවත්වනු ලැබේ. වකගඩු රෝගය සම්බන්ධයෙන් වැඩි අවදානමක් පවතින ප්‍රදේශවල කරන ලද හඳුනා ගැනීමේ සායනවලින් පෙනී ගොස් ඇත්තේ ඉලක්කගත ජනගහනයෙන් (වයස අවුරුදු 20-60) සියයට 8-10 අතර ප්‍රමාණයක් මුත්‍ර සහ ලේ පරීක්ෂාවලදී ධන අගයන් වාර්තා කරන බවයි.

එබැවින්, අවදානමට ලක්වී ඇති ප්‍රදේශවල ජනයා රෝගය වැළඳී ඇත්දැයි පරීක්ෂාවට ලක් කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. යම් කෙනෙකුට රෝගය වැළඳී ඇතිදැයි සිතන්නේ නම් ළඟම පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානයට ගොස් පරීක්ෂා කර ගැනීම සිදු කළ යුතුය. වඩාත් වැදගත් පණිවිඩය වනුයේ, අවදානම් ප්‍රදේශවල සිටින සියලු දෙනා පරීක්ෂාවට භාජනය කර ඊට අදාළව වෛද්‍ය උපදෙස් පරිදි කටයුතු කිරීමයි.

මේ කටයුත්ත සඳහා රජය විසින් මේ වන විට ඊට අවශ්‍ය භෞතික හා මානව යන දෙඅංශයෙන්ම යටිතල පහසුකම් වැඩි දියුණු කරමින් පවතී. විශේෂයෙන් රෝගය හඳුනා ගැනීම සඳහා වන ජංගම සායන බස් රථ සපයමින් රෝගීන් ළඟට ගොස් පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු සිදු කරමින් පවතී.

## 3. රෝගීන්ට ප්‍රතිකාර කිරීම

රෝගය වැළඳී ඇති ප්‍රදේශවල මහජනයා සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය යටිතල පහසුකම්, මානව සම්පත් සංවර්ධනය ඇතුළු කටයුතු මේ යටතේ සිදු වේ. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු ඒ සම්බන්ධ ආයතන විසින් මේ කෙරේ විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කරයි.

රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, වකුගඩු ඒකක (Renal Unit) ඇති කිරීම, වකුගඩු බද්ධ කිරීමේ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, රුධිර කාන්දුකරණ යන්ත්‍ර Dialysis Machine පහසුකම් ලබාදීම හා ''ගෘහස්ථ පරිතාන කාන්දුකරණ ප්‍රතිකාර ක්‍රමය'' ප්‍රචලිත කිරීම ආදී කටයුතු සිදු කරයි. මීට අමතරව මේ වන විට වකුගඩු රෝගීන් සඳහා චීන ජනරජයේ මූලාධාර යටතේ පොළොන්නරුව ප්‍රදේශයේ වකුගඩු රෝහලක් ඉදිකිරීම සඳහා ද කටයුතු කරමින් පවතී. තවද, අනුරාධපුරය, මහනුවර හා ගිරාඳුරුකෝට්ටේ රෝහල් ආශ්‍රිතව රෝගීන්ට නවාතැන් හා සුභසාධන පහසුකම් සඳහා ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම ආරම්භ කර ඇත.



## 4. රෝගියා පවුල සහ ප්‍රජාව සඳහා සුභසාධනය

මෙම රෝගයට වැඩි වශයෙන් ගොදුරු වී ඇත්තේ පවුලේ ගෘහ මූලිකයා වන අතර මේ හේතුවෙන් පවුලේ ආර්ථිකය දැඩි බලපෑමකට ලක් වී ඇත. පවුලේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ඇනහිටීම හේතුවෙන් මෙවැනි පවුල් යළි නගාසිටුවීම සඳහා සුබසාධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී රෝගයට ගොදුරු වූ රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම හා අනෙකුත් වියදම් සඳහා සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය මූලිකත්වය ගෙන රුපියල් 5000ක දීමනාවක් ලබා දෙමින් පවතී. මීට අමතරව මව හෝ පියා මිය ගිය පාසල් දරුවන් වෙනුවෙන් තම අධ්‍යාපන කටයුතු කර ගෙන යාම සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම "ජාතික වකුගඩු අරමුදල" හරහා සිදු වෙමින් පවතී. මේ යටතේ 2017 ජනවාරි මාසය වනවිට රෝගය ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක 10ක වකුගඩු රෝගයෙන් පියා හෝ මව මිය ගිය උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 128 දෙනකුට ශිෂ්‍යත්ව ලබාදීම ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව වකුගඩු රෝගීන්ගේ සහ රෝගයෙන් සුවය ලබා ඇති පුද්ගලයින්ගේ පවුල්වල ජීවනෝපාය නගාසිටුවීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති හඳුන්වාදීම සහ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකරණය සඳහා ද වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

## 5. පිරිසිදු පානීය ජල සම්පාදනය

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මෙම රෝගයට ගොදුරු වී ඇති ජනතාව සඳහා පිරිසිදු පානීය ජලය සැපයීම තුළින් මෙම රෝගයේ බලපෑම බොහෝ දුරට අඩුකර ගත හැකි බව නිර්දේශ කර ඇත. මේ හේතුවෙන් මෙම රෝගයට පිළියම් සෙවීමේ කෙටි කාලීන ක්‍රියාමාර්ගයක් ලෙස පිරිසිදු පානීය ජලය සම්පාදන කටයුතු සිදු කරමින් පවතී. මෙහිදී අංශ කිහිපයක් යටතේ රෝගී අවදානමට ලක්වී ඇති ප්‍රදේශවල මහජනයා සඳහා පිරිසිදු පානීය ජල සම්පාදනය සඳහා පහත සඳහන් ව්‍යාපෘති සිදු කරයි.

- ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති ලබාදීම.
- ජල මාර්ග දීර්ඝ කිරීම හා ජලපවහන පද්ධති වැඩි දියුණු කිරීම.
- අලුතින් ග්‍රාමීය ජල ව්‍යාපෘති ඇරඹීම.
- බවුසර් මගින් ජලය සැපයීම.
- ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂාව.
- වැසි ජල ටැංකි ඉදිකිරීම.

අතිගරු ජනාධිපතිතුමාගේ දැක්මට අනුව 2017 වසර අවසාන වන විට රෝගය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම ජාතික වගකීමක් සේ සලකා කටයුතු සිදු කෙරෙමින් පවතී. එයට අදාළව වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බළකාය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව මෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රධාන ක්‍රියාකාරී දායකත්වයක් සපයමින් සිටී.



## 6. සෞඛ්‍යාරක්ෂිත ආහාර හා පෝෂණය

අවශ්‍ය මාර්ගෝපදේශ, සහනාධාර, නව තාක්ෂණය සහ යන්ත්‍රෝපකරණ ආදී භෞතික හා මානව සම්පත් සැපයීම තුළින් "වස විසෙන් තොර ගොවිතැන" ප්‍රවර්ධනය හා සෞඛ්‍යාරක්ෂිත ආහාර රටාවකට ජනයා හුරුකිරීම තුළින් වකුගඩු රෝගය වැනි රෝගවලට ගොදුරු වීම පාලනය කිරීම.

වකුගඩු රෝගය සඳහා බලපාන කාරණා රැසක් අනුමාන කර ඇති අතර කෘෂිරසායන භාවිතය ද ඒ අතරින් එක් හේතුවකි. එබැවින් කෘෂි රසායන් භාවිතය මගින් වකුගඩු රෝගය ඇතිවීම සඳහා විය හැකි බලපෑම අවම කිරීම, වසවිස නැති ගොවිතැන් ප්‍රවර්ධනය කිරීම මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, සෞඛ්‍යාරක්ෂිත ආහාර රටාවකට ජනතාව හුරුකරවන අතර කාබනික පොහොර ප්‍රවර්ධනය හා ගොවි ජනතාවට පාරිසරික කෘෂිකාර්මික පිළිවෙත් හුරු කරවීම තුළින් සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබා ගැනීමට පාරිභෝගිකයාට ඇති අවකාශය වැඩි කිරීම මේ යටතේ සිදු කෙරේ.

## 7. සක්‍රීය නිරීක්ෂණ හා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම

සක්‍රීය නිරීක්ෂණ දත්ත පද්ධතිය තුළින් ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගයේ ස්වභාවය, කාල ප්‍රවණතා, භූගෝලීය ව්‍යාප්තිය ඇතුළු අනෙකුත් සාධකව පිළිබඳ ලබාදෙන දත්ත ඉදිරි පර්යේෂණ කටයුතු සහ ප්‍රතිපත්ති සම්පාදනයට පහසුකම් සැපයීම සිදුවේ. නිදන්ගත වකුගඩු රෝගීන් පිළිබඳ සියලු තොරතුරු මෙන්ම රෝග ව්‍යාප්තිය, රෝගය ඇතිවීමට හේතු විය හැකි යැයි අනුමාන කරන සාධකයන්හි බලපෑම සහ භෞතික හා මානව සම්පත් පිළිබඳ දත්ත කඩිනමින් ලබා ගැනීම සඳහා සක්‍රීය නිරීක්ෂණ දත්ත පද්ධතියක් ස්ථාපිත කර යාවත් කාලීනව පවත්වා ගෙන යාම.

නිරීක්ෂණ දත්ත පද්ධතියක් ස්ථාපිත කර යාවත්කාලීනව පවත්වා ගෙන යාම.

වකුගඩු රෝගයේ කාලානුරූප වෙනස්කම් අවබෝධ කර ගැනීම සඳහා සක්‍රීය නිරීක්ෂණ දත්ත පද්ධතිය තුළින් අවකාශය ලැබේ. මෙහිදී රෝගීන් සහ රෝග ව්‍යාප්තිය පිළිබඳ සියලු තොරතුරු මෙන්ම, රෝගය ඇති වීමට හේතු විය හැකි සාධකයන් හි බලපෑම ආදී තොරතුරු ද මීට ඇතුළත් වේ. මෙම සියලු තොරතුරු පාර්ශ්වකාරී ආයතන, ස්වාධීන පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල පර්යේෂණ අංශවල සිටින පර්යේෂණකයින්ට භුවමාරු කර ගැනීමේ පහසුකම් ඇති කරනු ලැබේ. රෝගය ඇති කිරීමේ විභවයක් සහිත සාධකයන්ගේ බලපෑම අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය දිගු කාලීන පර්යේෂණ සහ අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට වේදිකාවක් ලෙස මෙම පද්ධතිය ක්‍රියාත්මක වනු ඇත.

## 8. සමීක්ෂණ, පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්පාදනය


මෙම රෝගයෙන් මෙරට ජනයා මුදවා ගැනීම සඳහා මෙම රෝගයට මූලය නිවැරදිව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. වකුගඩු රෝග නිවාරණ කාර්ය සාධන බළකාය මගින් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ ස්වාධීන පර්යේෂකයින් උපයෝගී කර ගනිමින් පර්යේෂණ ක්‍රියාවලිය වේගවත් කිරීමට කටයුතු කරමින් පවතී.

විශේෂයෙන් මීට අදාළ දෙස් විදෙස් පර්යේෂකයින් හා පර්යේෂණ ආයතන ඒකාබද්ධ කරමින් රෝග මූලය සෙවීම සඳහා වන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සපයන්නෙකු ලෙස ද කටයුතු සිදු කරයි. මේ වන විටත් මෙවැනි වැඩමුළු රාශියක් පවත්වා ඇත. එහිදී විදෙස් රාජ්‍යයන්හි පර්යේෂණ කණ්ඩායම් උපයෝගී කරගෙන පර්යේෂණ කටයුතු සිදු කිරීම ද සිදු වේ.



# මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය සඳහා වූ ජාතික සැලැස්ම 2016-18

වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සෙසු රාජ්‍ය ආයතන හා පුද්ගලික අංශයේ ආයතන ගණනාවක විශාල දායකත්වයක් ඇතිව ක්‍රියාත්මක කරනු ලබන දැවැන්ත වැඩසටහනකි. මෙහිදී ප්‍රධාන ක්ෂේත්‍ර 08ක් ඔස්සේ නිදන්ගත වකුගඩු රෝග නිවාරණයට අදාළ සැලසුම් සකස් කර ඇත.





2016 වසරේ අවදානම් දිස්ත්‍රික්ක 11 සඳහා ප්‍රමුඛතාව ලබා දුන් අතර 2017/18 වසරවලදී අනෙකුත් දිස්ත්‍රික්ක 14 සඳහා ද අවශ්‍යතාව පරිදි පහසුකම් ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතය.

මෙම සැලැස්ම ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය. ජාතික මට්ටමේදී ජනාධිපති කාර්ය සාධන බලකාය සහ පාර්ශ්වකාරී අමාත්‍යාංශ විසින් ද, පළාත් මට්ටමේදී පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන මගින් ද වගකීම් පැවරී ඇති විෂය ක්ෂේත්‍ර යටතේ අදාළ කාර්යයන් සිදුකරනු ඇත.

ජාතික මට්ටමින් හා පළාත් මට්ටමින් අදාල දිස්ත්‍රික්කය සඳහා යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහයෝගය අපේක්ෂා කරනු ලැබේ. එමගින් ග්‍රාමීය මට්ටමේදී වකුගඩු රෝග නිවාරණය ග්‍රාමීය කමිටු මගින් අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර මේ සඳහා ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන් හා සිවිල් සංවිධානයන්හි සහය ලබාගැනීමට නියමිතය.

## ජාතික වකුගඩු අරමුදල

වකුගඩු රෝග නිවාරණ කටයුතු සඳහා මුදල් සොයා ගැනීමේ අරමුණින් "ජාතික වකුගඩු අරමුදල" පිහිටුවා ඇති අතර, විවිධ දානපතීන්ගේ අනුග්‍රහය යටතේ මේ වන විට මෙම අරමුදල රුපියල් මිලියන 541 ඉක්මවා ඇත. මේ සඳහා ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 0077591955ට මුදල් යොමු කිරීමෙන් ඔබට ද දායක විය හැක.වකුගඩු රෝගය වැළැක්වීම සඳහා කටයුතු කිරීම වෙනුවෙන් මෙසා විශාල වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවා ඇති අතර, මෙම සත්කාර සඳහා ඔබ සැමගේ නොමඳ දායකත්වය ලබාදීම තුළින් මෙම රෝගයෙන් පෙළෙන ජනතා මුදාගැනීම සඳහා කටයුතු කිරීම අප සැමගේ යුතුකමක් මෙන්ම ප්‍රධාන වගකීමක් වන්නේය.





# වකුගඩු මාරයාට එරෙහි සටන

# ඊයේ අද සහ හෙට

**වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය" විසින් පසුගිය කාලය තුළ කළ ඉටු කළ වැඩ කොටස පිළිබඳ පසුවිපරමක යෙදුණා. මේ ඒ ගැන විමසා බැලීමක්.**

## පිරිසිදු පානීය ජලය ලබාදීම

මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය සහ පානීය ජලය අතර සම්බන්ධයක් ඇතැයි පර්යේෂකයින් විශ්වාස කරනවා. ඒ අනුව රෝගයෙන් වැළකී සිටීමට මෙන්ම රෝගයට ගොදුරු වූවන්ට ද පිරිසිදු පානීය ජලය ලබාගැනීමට පහසුකම් සැලසීම අත්‍යවශ්‍ය කාරණයක් වශයෙන් සැලකෙනවා.




මෙම ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම අත්‍යවශ්‍ය කරුණක් බවට වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විශ්වාස කරනවා. ඒ අනුව 2018 වසර වනවිට වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වී ඇති ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය සැපයීම සහ ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධතිය RO PLANT ලබාදීමට සැලසුම් කොට තිබෙනවා. ඒ අනුව පිරිසිදු පානීය ජලය ලබාදීමේ වැඩසටහන යටතේ 2016 වසරේදී වකුගඩු රෝගී අවදානම පවතින දිස්ත්‍රික්ක 11හි බලපෑමට ලක්වී ඇති බල ප්‍රදේශවලට හා පාසල්වලට ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති 185ක් ලබාදී තිබෙන අතර 2017දී ප්‍රති ආශ්‍රැතිකරණ පද්ධති 106ක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට රුපියල් මිලියන 162කට ආසන්න මුදලක් ප්‍රතිපාදන වශයෙන් ලබා දුන්නා. මී සමගාමීව පුද්ගලික අංශයේ ආධාර මත මේ වන විට රුපියල් මිලියන 37ක පමණ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා.


## ගෘහස්ථ ජල පෙරණ හා වැසි ජල ටැංකි ලබාදීම

නිවාස ඒකක වශයෙන් පිරිසිදු පානීය ජලය ලබාදීමේ අභියෝගය ජය ගැනීම සඳහා වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් ITI ආයතනය මගින් නිෂ්පාදනය කළ ගෘහස්ථ ජල පෙරණ උපකරණ කට්ටල 588ක් වකුගඩු රෝගී පවුල් සඳහා ලබා දුන්නා. ( අනුරාධපුර 200, වවුනියා 100, බදුල්ල 276, මාතලේ 12) මෙම වැඩසටහන යටතේ අනුරාධපුර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල රෝගීන් අතර වැසි ජල ටැංකි 105ක් බෙදා හැර ඇති අතර මෙම වැඩපිළිවෙළ ඉදිරියටත් ක්‍රියාත්මක වෙනවා.


## සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය



මෙමෙහෙන්සිරි සෙවණ වකුගඩු රෝගී සුභසාධන ඒකකයේ ආකෘතිය
අනුරාධපුර මහ රෝහල



මහනුවර රුධිර කාන්දු පෙරීම් මධ්‍යස්ථානය, වකුගඩු රෝගී සහන ඒකකය සහ සුබසාධන ඒකකයේ ආකෘතිය




ගිරාඳුරුකෝට්ටේ ඉදිකිරීමට යෝජිත වකුගඩු රෝග සම්බන්ධ සමාජ සුබසාධන, ආර්ථික සවිබලගැන්වීමේ අධ්‍යාපන හා තොරතුරු කේන්ද්‍රයේ ආකෘතිය

වකුගඩු රෝගයට ගොදුරුව සිටින අති බහුතරය රටට බත සපයන ගොවි ජනතාව. ඔවුන් ජීවත් වන්නේ නගරයෙන් ඉබාහෝ ඈත ගම් ප්‍රදේශවල. ඒත් ඔවුන්ට ප්‍රතිකාර සඳහා අනිවාර්යයෙන් නගරයේ ඇති රෝහල් කරා ඒමට සිදු වෙනවා.

පවුලේ ගෘහ මූලිකයා වන පියා හෝ මව වකුගඩු රෝගයට ගොදුරු වූ විට මෙන්ම දරුවකු හෝ සමීප ඥාතියෙකු රෝගයට ගොදුරු වුවත් එකී පවුල්වලට රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වෙනවා. ගමන් බිමන්, බෙහෙත්, ආහාර පාන වගේම ඇතැම් විට නවාතැන් පහසුකම් සපයා ගැනීම සඳහා පවා විශාල මුදලක් දැරීමට සිදුවෙනවා. තමන්ගේ ගේ දොර කටයුතු,

මගා කටයුතු අතපසු කරමින් රෝගීන් අසල ගත කිරීමට සිදුවෙනවා. විශේෂයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දුර බැහැර ගම්මානවල සිට නගරයේ රෝහල් කරා පැමිණෙන වකුගඩු රෝගීන් සහ ඔවුන්ගේ භාරකරුවන් නවාතැන් පහසුකම් සපයා ගැනීමේදී දැඩි පීඩාවන්ට පත් වෙනවා. මේ තත්ත්වය මුනාව මටහා ගත් වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය වකුගඩු රෝගීන් හා ඔවුන්ගේ භාරකරුවන්ට නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා නේවාසිකාගාර ඉදිකිරීමට විශේෂ අවධානයක් යොමු කළා. ඒ අනුව, රුපියල් මිලියන 218ක වියදමින් "වකුගඩු රෝගී සුබසාධන සහන සත්කාරක සය මහල් නේවාසිකාගාර සංකීර්ණය" මහ නුවර මහ රෝහලේ ද, රුපියල් මිලියන 157ක් වැය වන "මෛත්‍රී සෙවණ නේවාසිකාගාර සංකීර්ණය අනුරාධපුර මහ රෝහලේ ද රුපියල් මිලියන 28ක වියදමින් "වකුගඩු රෝග සම්බන්ධ සමාජ සුබසාධන, ආර්ථික සවිබල ගැන්වීමේ අධ්‍යාපන හා තොරතුරු කේන්ද්‍රය ගිරාඳුරුකෝට්ටේ රෝහලේ ඉදිකිරීමට පියවර ගෙන තිබෙනවා.

2016 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘති 2018 වසරේදී ජනතාවගේ සේවාව සඳහා පවරාදීමට නියමිතව තිබෙනවා. ශ්‍රී ලංකා යුද හමුදාව සහ නාවික හමුදාව මෙම ඉදිකිරීම් භාරව කටයුතු කරනවා. මෙම ව්‍යාපෘතිවලට සමගාමීව, මාලිගාවත්ත මහ රෝහලේ නවීකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ චීන ආධාර යටතේ පොළොන්නරුව වකුගඩු රෝහල ඉදිකිරීමේ කටයුතු සම්බන්ධීකරණය වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් සිදුවෙනවා.

## සුබසාධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම



මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වන අති බහුතරය වන්නේ පිරිමින්. පවුලක ගෘහ මූලිකයා වන පියා වකුගඩු රෝගය ගොදුරු වූ විට බොහෝ දුරට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, විශේෂයෙන් උසස් අධ්‍යාපන කටයුතු බිඳ වැටෙනවා. මේ තත්ත්වයෙන් පීඩාවට පත් පවුල්වල දරුදැරියන් මුදවා ගැනීම සඳහා වකුගඩු රෝග නිවාරණ කාර්ය සාධන බලකාය විසින් වකුගඩු රෝගයෙන් දෙමාපියන් අහිමි වූ අපොස (උසපෙළ) සිසු, සිසුවියන් සඳහා "ජනාධිපති අධ්‍යාපන ශිෂ්‍යත්වය" නමින් ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබෙනවා.

ඒ අනුව 2016 වසරේදී ජනාධිපති අධ්‍යාපන ශිෂ්‍යත්ව 130ක් ද (අනුරාධපුර 64, වවුනියාව 14, බදුල්ල 33, ත්‍රිකුණාමලය 19) 2017 වසරේදී ශිෂ්‍යත්ව 109ක් ද (අනුරාධපුර 52, බදුල්ල 23, අනෙකුත් දිස්ත්‍රික්ක 34) ප්‍රදානය කර තිබෙනවා.

මීට සමගාමීව සමාජ සවිබලගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශය මගින් මූලය අවිනිශ්චිත වකුගඩු රෝගය පැතිරී ඇතැයි නිර්ණය කර ඇති දිස්ත්‍රික්කවල වකුගඩු රෝගීන් වෙනුවෙන් රුපියල් 5000.00ක දීමනාවක් ද ලබාදෙනවා.



## පර්යේෂණ කටයුතු සිදු කිරීම

රජරට ඇතුළු දිවයිනේ දිස්ත්‍රික්ක 11ක රෝගීන් වාර්තා වන වකුගඩු රෝගය සඳහා හේතු වන කරුණු සහ එය නිවාරණය කරන ක්‍රමවේද මේ දක්වා නිශ්චිතව හඳුනා ගෙන නැහැ. මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ විවිධ ආයතන හරහා අඛණ්ඩව සිදු වෙනවා.

පහත සඳහන් විශේෂ වැඩසටහන් පසුගිය කාලය තුළ පවැත් වුණා.

- 2015 දෙසැම්බර් මස 16 වැනි දා දෙස් විදෙස් පර්යේෂකයින්ගේ සහභාගිත්වයෙන් විශේෂ සමුළුවක් පැවැත් වුණා.
- 2016 මාර්තු මස 15 වැනිදා චීන විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළුවක් පැවැත් වුණ අතර ඊට සමගාමීව පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා රසායනාගාරයක් ද චීන රජය විසින් ප්‍රදානය කළා.
- 2016 අප්‍රේල් මස 26,27 හා 28 යන දිනවලදී ලෝක සෞඛ්‍ය සංවිධානය සමග සමගාමීව දෙස් විදෙස් සමුළුවක් පැවැත් වුණා.
- 2017 ජූලි මස 13 සහ 14 යන දෙදින පුරා මූලය හඳුනා නොගත් වකුගඩු රෝගයට හේතුව හඳුනා ගැනීමේ පර්යේෂණ පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුව කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් වුණා.

## වකුගඩු රෝගීන් පෙර හඳුනා ගැනීමේ කටයුතු

යම් කිසි පුද්ගලයෙක් වකුගඩු රෝගයට ගොදුරු වීමට පෙර හඳුනා ගැනීමට හැකි වන්නේ නම් ඔහුගේ රෝගී තත්ත්වය පාලනය කිරීමේ වැඩි හැකියාවක් තිබෙනවා. ඒ නිසා වකුගඩු රෝගය පිටුදැකීමේදී වකුගඩු රෝගීන් පෙර හඳුනා ගැනීම ඉතාම වැදගත් වෙනවා.

මේ වන විට වකුගඩු රෝග නිවාරණ දිස්ත්‍රික් මට්ටමේ ජාතික වැඩසටහන් හතරක් (4)ක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ අනුව බදුල්ල, අනුරාධපුරය, වවුනියා සහ මාතලේ දිස්ත්‍රික්කවල ඊට සමගාමීව වකුගඩු රෝගීන් පෙර හඳුනා ගැනීමේ SCREENING කටයුතු කර තිබෙනවා. ඒ අනුව වවුනියාව 1000, බදුල්ල 28,000ක් අනුරාධපුර 1000ක් පමණ, විල්ගමුව 20,060ක් සහ වැලිඔය 3802ක් පෙර හඳුනා ගැනීමේ පරීක්ෂණ සඳහා ලක්කර තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වසරක රෝගීන් ලක්ෂ පහක් බැගින් Screening කිරීමට අපේක්ෂා කරනවා.

## 2017 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකායේ 2017 වසරේ කටයුතු සඳහා රුපියල් මිලියන 302 ක ප්‍රතිපාදන වෙන් කොට තිබෙනවා. ඒ යටතේ,

- සක්‍රීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන (3) තුනක් ද,
- රෝග නිවාරණය සඳහා චර්යා ප්‍රවර්ධනය, පිරිසිදු පානීය ජලය සම්පාදනය, රෝගීන්ට ප්‍රතිකාර කිරීම, රෝගියා පවුල සහ ප්‍රජාව සඳහා සුභසාධනය, රෝගීන් පෙර හඳුනා ගැනීම, සහ සෞඛ්‍ය ආරක්ෂිත ආහාර හා පෝෂණය ආදී කටයුතු සඳහා රුපියල් මිලියන 187ක් ද,
- සමීක්ෂණ, පර්යේෂණ, ප්‍රතිපත්ති සම්පාදනය, සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු කිරීම් ආදි කටයුතු සඳහා රුපියල් මිලියන (5) පහක් ද,
- පසුවිපරම, අධීක්ෂණය ප්‍රගති සමාලෝචනය, ජාතික උත්සව පැවැත්වීම හා වෙනත් කටයුතු සඳහා රුපියල් මිලියන 107ක් ද,

ප්‍රතිපාදන වශයෙන් වෙන් කර තිබුණා. මෙයින් රුපියල් මිලියන 298ක් නිදහස් කර තිබෙනවා.

ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අරමුණ වන්නේ රටට බත බුතල සපයමින් රටේ ජනතාවගේ කුසගිනි නිවන ගොවිජනතාව බිලිගනිමින් සිටින වකුගඩු මාරයා සම්පූර්ණයෙන්ම පරාජය කොට රජරට ඇතුළු මුළු මහත් ගොවිජනතාවටම සුරක්ෂිතව ජීවත්විය හැකි සුබිත මුදිත ශ්‍රී ලංකාවක් බිහි කිරීම. මේ මහා සංග්‍රාමය සඳහා නායකත්වය දෙන "වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය" එකී සමන ජයග්‍රහණය කරනු ඇති බව සහතිකයි. ඒ සඳහා අපි සියලු දෙනාම ඇපකැප වෙමු. මේ සටන අපි සියලු දෙනාගේම සටනක් බවට පත් කර ගනිමු.

සැකසුම
තුෂාල් විතානගේ



# මොරගහකන්ද දියවර සේ ගලමි මම

අ.ප. පක්ෂයේ 66 වැනි සංවත්සරය එළඹෙන මේ මොහොතේ මගේ හෘද සාක්ෂිය තුළ නැගෙන්නට වූ අවංක සිතිවිලි සමුදායෙන් බිඳක් මෙසේ ඔබ අතට පත් කරන්නෙමි

## හෘදය සාක්ෂියේ ප්‍රතිරාවය

මා සිතන්නේ එය මාගේ නිල කටයුත්තකට වඩා ඔබත් මාත් බැඳී සිටින සදාතන දේශපාලන වගකීම ඉටු කිරීමක් ලෙසය. ඔබ දේශපාලන වේදිකාවල මොන දේ ප්‍රකාශ කළත් ඒ සියල්ලම ඔබගේ හෘදයාංගම අදහස් ම නොවන බව මම විශ්වාස කරමි. මා ද ඇතැම් අවස්ථාවල දේශපාලන වේදිකාවල මාගේ හෘද සාක්ෂිය නිහඬ කර, මාගේ බුද්ධියෙන් කතා කළ බව රහසක් නොවේ. එය දේශපාලනික යථාර්ථයකි. පක්ෂයක් යනු බලය උදෙසා පවත්වා ගෙන යන යාන්ත්‍රණයකි.

ඒ යාන්ත්‍රණයේ මෙහෙයුම් නායකත්වය විසින් සිදු කරනු ලැබුව ද පක්ෂයේ සියල්ලෝම ඊට ජීවය සපයන්නෝය යනු මගේ අදහසයි. එහෙත් පක්ෂවල මෙම යාන්ත්‍රණයේ ඇණ මුරුච්චි බවට පමණක් පත් වන පිරිසක් ද සිටිති. එසේ වුව ද පක්ෂ යාන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාත්මක වීමට නම් හැම ඇණයක්ම, හැම මුරුච්චියක්ම වැදගත් බව මගේ අදහසයි.

මා අද ශ්‍රීලනිපයේ නායකයා පමණක් නොව, ශ්‍රී ලංකාවේම නායකයා බවට පත්වී සිටියත් මගේ දේශපාලනයේ සමාරම්භය

ශ්‍රීලනිපය මට විවර කළ දොරටුව ඔස්සේ එහි හිණිපෙත්තටම ගමන් කිරීමේ භාග්‍යය මම ලදිමි. එහෙත් දෛවය විසින් මට පවරන ලද ජාතික අභිලාෂයක් විජයග්‍රහණය කිරීම උදෙසා දේශපාලන අභියෝගයක් භාර ගැනීමට මට සිදුවිය. ඒ පිළිබඳව මා තුළ ඇත්තේ අප්‍රමාණ සතුටකි.

කුමක්දැයි ඔබ ඉඳුරාම දන්නෙහිය. කොළඹින් සැතපුම් ගණනක් ඈතින් පිහිටි රජරට පොළොන්නරුවේ ගොවි පවුලක ගොවි පුතෙකු ලෙස උපන් මගේ දේශපාලන තක්සලාව ගම බව අමුතුවෙන් කිවයුතු නැත. වරප්‍රසාද පාන්තියක, වරප්‍රසාද ආර්ථික පහසුකම් අහිමි වූ මා වැනි ඉතා කුඩා මිනිසෙකු මේ සා දුරක් ගමන් කිරීමේ රහස මගේ අවංකභාවයත්, වැඩ කිරීමට ඇති කැමැත්තත්, මගේ ජනතාවගේ දුක නැති කිරීමේ අවංක වුවමනාවත් බව මා කිව යුතුය.

## ජාතියේ ඉරණම

ශ්‍රීලනිපය මට විවර කළ දොරටුව ඔස්සේ එහි හිණිපෙත්තටම ගමන් කිරීමේ භාග්‍යය මම ලදිමි. එහෙත් දෛවය විසින් මට පවරන ලද ජාතික අභිලාෂයක් විජයග්‍රහණය කිරීම උදෙසා දේශපාලන අභියෝගයක් භාර ගැනීමට මට සිදුවිය. ඒ පිළිබඳව මා තුළ ඇත්තේ අප්‍රමාණ සතුටකි. මා නොවන්නට එදා බණ්ඩාරනායක ශ්‍රීමතාණන් මේ සුවිශේෂ අනන්‍යතාව මේ වන විට මැකී විරූපී වී ගොස් අවසාන වන්නට ද ඉඩ තිබුණු බව පවසතොත් ආත්ම වර්ණනාවක් නොවන බව ඔබ හොඳින් දනී. මට භාර වූයේ අපේ පාක්ෂිකයින්ගේ පමණක් නොව, මේ රටේ බහුතර ජනතාවකගේ අප්‍රසාදයට, පිළිකුළට ලක්ව තිබුණු පක්ෂයකි.

එදා ශ්‍රීලනිපය මෙන්ම සන්ධානයේ ද අනුබල අනුග්‍රහයෙන් යුතුව, රටේ සම්මතව තිබුණු ව්‍යවස්ථාව තම සිතැගි පරිදි වෙනස් කරගත් අයෙකු සමග මට තරගයකට ඉදිරිපත් වීමට සිදු වූ බව ඔබ දන්නෙහිය. ඒ පිළිබඳව ඔබට ද විවේචනයක් තිබෙන බව මම දනිමි. එහෙත් මා එලෙස තරග වැදුණේ ඇයි ? මගේ කුමන දොළදුකක් සන්සිඳුවා ගැනීමටද ? මගේ සනුහරයේ ආරක්ෂාව හෝ අභිලාෂයන් ඉටු කිරීමට ද ? මට ඔටුනු පැළඳවීමට කුමාරයෙන් නොසිටි බව ඔබ දන්නෙහිය. මගේ ඉතිහාසයේ අතිශය තීරණාත්මක මොහොතක ජාතියේ ඉරණම වෙනස් කිරීම උදෙසා මගේ හෘද සාක්ෂියට එකඟව දුෂ්කර තීරණයක් ගත් දේශපාලනඥයෙක් වන්නෙමි.

සත්තකින්ම මා ඒ පියවර නොගෙන, මට ප්‍රදානය කිරීමට සහතික වශයෙන්ම සූදානම් කළ අගමැති ධුරය නමැති 'ත්‍යාගය' පිළිගැනීමට එකඟ වූයේ නම් කුමක් සිදුවිය හැකිව තිබිණිද ? ආණ්ඩුව කෙරෙහි, රාජ්‍ය නායකත්වය කෙරෙහි කැකෑරෙමින් තිබුණු අරාජික මෙන්ම බිහිසුණු දේශපාලන අගාධයෙන් රටත්, ජනතාවත් මුදා ගැනීමට මට වුවමනා විය. එය අවදානම් සහගත භයානයක දේශපාලන තීන්දුවක් බව මගේ සමීපතමයෝ ද කියා සිටියහ. මගේ නායකයා සමග පෞද්ගලික මතභේදයක් මට නොවීය. දේශපාලන වේදිකාවලදී මගේ ප්‍රතිවාදීන් හැසිරුණු ආකාරය ලොමුදැහැගන්වන සුළු වුව ද මට බියක්, සැකයක් නොදැනිණි. ඒ මගේ අරමුණ උතුම් දෙයක් වූ නිසාය.

මට එරෙහිව දියත් කරන ලද දේශපාලන මෙහෙයුම අශීලාචාර අමනෝඥ ක්‍රියාවලින් දූෂිත වූවක් බව ඔබ දන්නෙහිය. තර්ජන, බියවැද්දීම්, චරිත ඝාතන, නීතිය හා යුක්තිය නිහඬ කිරීම, සමස්ත රාජ්‍ය බලයම නිරායුධ, එහෙත් නිර්භය තම ප්‍රතිවාදියා මැඩලීම සඳහා යොදා ගැනීම එම ජනාධිපතිවරණයේ සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබුණි. නිලය, බලය, ධනය, සාහසිකත්වය වැනි කුරිරු අවි සමග සටන් කිරීමට මා තුළ වූයේ අවංක බව, අභීත බව හා සිංහල, දෙමළ, මුස්ලිම් ආදි සියලු ජන හදවත් තුළ දිදුලමින් තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී අපේක්ෂාවන් බව මම දුනුදු පවසන්නෙමි. ඒවා අසත්‍යද ? නැතහොත් පදනම් විරහිත චෝදනාද ? යන්නට ඔබගෙන් මම අද පිළිතුරක් බලාපොරොත්තු වෙමි. එය අපගේ පක්ෂයේත්, රටේත් යහපත වෙනුවෙන් වුවමනා අවංක පිළිතුරක්, මෙන්ම ඔබගේ හෘදය විදාරණයක් ලෙස ද මම සලකමි.

## පක්ෂයේ විනාශය වැළැක්වීම

පුද්ගල අභිවාදනය යනු දේශපාලනයේ සනාතන වලංගු න්‍යායක් නොවේ. ඉකුත් ජනාධිපතිවරණයේ ප්‍රතිඵල දේශපාලනික වශයෙන් ඔබ කියවා බැලිය යුතුය. එකම පවුලක් වටා භ්‍රමණය වන දේශපාලන සංගීත පුටු තරගයකට සහභාගීවීම උදෙසා ඔබේ ශක්තිය යෙදවීමට ඔබ තවමත් කැපවී සිටින්නෙහිද ? ඔබ තෝරා ගත යුත්තේ පවුලකට ඔටුන්නක් ලබාදීමේ දේශපාලනයක් ද ? පක්ෂ නායකත්වය යනු ඔටුන්නකට වඩා පාක්ෂිකයන් විසින් පොදු ජනතාවගේ එකඟතාව අනුව කෙරෙන ප්‍රදානයක් බව මම කල්පනා කරමි. ඒ ප්‍රදානය සිදු කළ අයෙකු තම අනුප්‍රාප්තිකයා දෙස දේශපාලන කුහකත්වයෙන් තොරව බැලීමට තරම් ආත්ම ශක්තියකින් යුතු නොවෙත් නම් එයම ඛේදවාචකයක් නොවෙන්නේද ?

ශ්‍රීලනිපයේ නායකයා ලෙස මට කළ ගෞරවනීය ප්‍රදානය' පිළිබඳව කෙරෙන ප්‍රකාශයන්හි සත්‍යතාව කුමක්දැයි ඔබ දන්නෙහිය. එය වර්තමාන දේශපාලනයේ ග්‍රාම්‍ය ස්වරූපය විදහාපාන ''මට මතක නැත-මම නොදනිමි'' යන විකෘතිය විදහාපාන නිහීනත්වය හා සමාන නොවේදැයි ඔබම සිතා බලනු මැනවි. කුමන පදනමක් යටතේ වුව ද ඔබ, පක්ෂයෙන් භේද ඉවත්කර ගැනීම සඳහා දියත් වන මෙහෙයුම්වල ඉත්තෙකු විය යුතු නැත. එසේම කිසිදු ජන පදනමක් නැති දේශපාලන කමේගුරන්ට ඔබට අයත්, අපගේ ගෞරවනීය පක්ෂය කෙමනක් කර ගැනීමට ඉඩදිය යුතු නැති බව මම උදක්ම කියා සිටිමි. සත්තකින්ම ගෙවී ගිය

දෙවසරකට නොඅඩු කාලය තුළත් අඳත් ඔබ භාවිත වන්නේ ශ්‍රීලනිපය දුබල කිරීමේ හා අපේ පක්ෂය විනාශ කර දැමීමේ කූඨ අරමුණ වෙනුවෙන් බව ඔබ නොදන්නෙහිද ? මේ 66 වැනි සංවත්සරය පැවැත්වෙන මොහොතේදීත් ඔබ එරෙහි වන්නේත්, පංගුකරුවකු වන්නේත් ඔබේම පක්ෂය විනාශ කිරීමට බව ඔබ වටහා නොගන්නේ නම් එය අපගේත්,, රටේත් අවාසනාව පමණක් නොව, මේ මාතෘභූමියේ අවසානය බව ද සිහිපත් කළ යුතුය. ශ්‍රීලනිපය මට භාර කළ අයම එය එසේ නොවේ යැයි කියති. පක්ෂයේ භාරකාරත්වය මට මට හිමිවීම නොඉවසන, නොරිසිවන බලවේග බුද්ධියෙන්, සිහිකල්පනාවෙන්, විමසිල්ලෙන් හඳුනා ගැනීමට පමණක් නොව, එක දේශපාලනිකව වටහා ගැනීමම ප්‍රමාද වන තරමටම සතුරෝ නැගී සිටිති. පුද්ගලවාදී කැරලි, අවස්ථාවාදී රංචු ගැසීම්වලින් සමන්විත දේශපාලන ඉතිහාසයේ සුසාන භූමිය කරා ඔබ රැගෙන යාමට කිසිවකුට ඔබ ඉඩ නොදිය යුතු දැයි ඔබම සිතා බලනු යෙහෙකි.

අද ශ්‍රීලනිපය දිය සිඳී ගිය වළක් ලෙස පෙන්වා ඔබ මල් පොහොට්ටු පිපෙන දේශපාලන මානසවිලට රැගෙන යාමට දේශපාලන බකතපස් රකින කාක කොකුන් පෙරට ඇවිත් සිටිති. එයට ගොදුරු වන්නෙහිද ? යන්න විවේක බුද්ධියෙන් විමසා බැලිය යුත්තේ ඔබමය. 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ බහුතර ජනතාව විසින් ජනාධිපතිවරයා ලෙස මා තෝරා ගන්නා ලද්දේ ඇයි ? ඒ පිළිබඳව සූත්‍රගත කර තිබෙන බොහෝ තොරතුරු මතුපිටින් විමසා බලා නිගමනයකට එළඹීමට ඔබ ඉක්මන් විය යුතු නැත. එය පැහැදිලිවම වෙනසක් සඳහා ගත් දිගු ගමනක අභීත පියවරක් පමණි. වෙනස සනිපදෑයි නිවටයෝ අසති. වේදිකාවල අපහාස කරති. එහෙත් ඒ වෙනස ජනතාව අපේක්ෂා කළ වෙනසම නොවේ

## සම්මුතියේ වැදගත්කම

ශ්‍රීලනිපය සහ එජාපය විසින් ඇතිකර ගන්නා ලද සම්මුතිය අනුව ගොඩනැගු ආණ්ඩුවක් ලෙස අප ආ ගමන ඔබ දන්නෙහිය.

ජනතාවේ [illegible] මේ පක්ෂ [illegible] ලබා නොදුන් [illegible] අපට ගත හැකි [illegible] කුමක්ද ? ඔබ [illegible] ශ්‍රීලනිපය ප්‍රමු[illegible] මෙහෙයවීම භාරගත් [illegible] අපේක්ෂකයා සමග [illegible] එකගතාවකට පැමිණියේ [illegible] බව ඔබ ඉඳුරා දන්නෙහිය.

එපමණක් නොව අප මේ රටේ ජනාධිපති ධූරය දෙවරක් හෙබ වූ ජේ.ආර්. ජයවර්ධන මහතා හා අපේම පක්ෂ නායිකාවක වූ චන්ද්‍රිකා මැතිණිය යළිත් පාර්ලිමේන්තුවට තරග නොකළහ. එහෙත් රාජපක්ෂ මහතා සිය දේශපාලන කඳවුරු බිමෙන් ද පැන ගොස් කුරුණෑගලින් ආසනයක් තරග කළ අයුරු ඔබ දන්නෙහිය. එයට නීති බාධාවක් නොවූණ ද එය ජනාධිපති සම්ප්‍රදාය හෑල්ලු කළ සිල්ලර දේශපාලනයක් නොවේ ද එය සිය තෙවන ඉනිම අවලංගු කරමින් ජනතාව විසින් දෙන ලද ප්‍රජාතන්ත්‍රවාදී තීන්දුවට කළ සරදමක් වැන්න.



ශ්‍රීලනිපය තුළ සියලු අවුල් නිර්මාණය වූයේ ඒ දේශපාලන ප්‍රතිචාර නිසා නොවේද ? මගේ පක්ෂයේ පිරිසකට හා සන්ධානයේ කීප දෙනකුට ඒකාබද්ධ විපක්ෂයක් ලෙස ක්‍රියා කිරීමට මම බාධා නොකළෙමි. ශ්‍රීලනිපය බෙදී යෑම වැළැක්වීමට මා ගත් ක්‍රියාමාර්ග ඔබ දන්නෙහිය. එකම ආණ්ඩුකට ප්‍රතිවිරුද්ධ පිල් දෙකක් සම්මුතියකින් ක්‍රියා කිරීම ඒකාබද්ධයේ ඔබ හැඳින්වූයේ පාවාදීමක් ලෙසය. එහෙත් මට බාධා කළ ඔබ කණ්ඩායම මෙහෙය වූ අයගේ අරමුණ වූයේ පක්ෂය කැඩීම බව ඔබ හොඳින් දන්නෙහිය. එහෙත් ඒකාබද්ධ විපක්ෂය ලෙස පදනම් විරහිත චෝදනා නගමින් ඔබේ කණ්ඩායම විසින් ප්‍රදර්ශනය කරන ලද දේශපාලන හැසිරීම කොතරම් නොමේරූ, ප්‍රාථමික එකක් දැයි ඔබ නොදන්නෙහිද ? මාත් අයත් වූ එදා ආණ්ඩුවට එජාපයෙන් යම් යම් අය එකතු වීම යහපත් දේශපාලනයක් බව එදා පිළිගත් අය එජාපය සමග ශ්‍රීලනිපය එක්වී ආණ්ඩුවක් හැදීම අපරාධයක් ලෙස දකිති.

සැබවින්ම "මෛත්‍රී' නමැති මා රාජ්‍ය නායකයා ලෙස නොසිටින්න අදට අද රට තිබෙන්නේ කොතැනකදැයි ඔබම සිතා බලනු මැනවි. මා අභියස බලය අහිමි අයෙකුට මා පිළිබඳව යහපත් සිතිවිලි නැති වීම මට තේරුම් ගත හැකිය. එහෙත් මා බිම දැමීම සඳහා රට වටේ ගොස් හති වැටෙන තුරු ඔබ කණ්ඩායම කළ දේශපාලනයෙන් රටට ලැබුණු යහපත කුමක්ද ? මා නොවන්නට විධායක ජනාධිපති ක්‍රමයේ සංශෝධනයක් සිදුවිය හැකිද ? මා නොවන්නට ජාත්‍යන්තරව අප පිළිබඳව තිබුණු දුර්මතය ඉවත් කරවීමට හැකි වනු ඇතැයි ඔබ සිතන්නෙහිද ? මෛත්‍රී-රනිල් සම්මුති ආණ්ඩුවක් හෝ ආර්. සම්බන්ධන්ට විපක්ෂ නායක ධුරයක් හෝ ලැබෙනු ඇතැයි ඔබ සිතන්නෙහිද ?

රාජපක්ෂ පාලනයෙන් ජනතාව අපේක්ෂා කළ කිසිවක් නොලැබී රට අගාධය කරා යමින් තිබුණු ගමන වෙනස් වූයේ මා රාජ්‍ය නායකයා බවට පත් වීමෙන් පසු නොවේද? ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන, ස්වාධීන කොමිෂන් සභා, අධිකරණයේ ස්වාධීනත්වය ආදී කිසිවක් මා නොවන්නට සිදුවනු ඇතැයි ඔබ සිතන්නෙහිද ? හමස් පෙට්ටියට දමා තිබුණු මොරගහකන්ද යෝජනා ක්‍රමය යථාර්ථයක් බවට පත්කර ගැනීමට මා නොසිටින්නට ඉඩක් ලැබෙනු ඇතැයි ඔබ සිතන්නෙහිද ? මා කිසි විටෙක දූෂණයට, භීෂණයට, වංචාවට, අයුක්තියට ඉඩ නොදුන් බව ඔබ දන්නෙහිය. මගේ මැදිහත්වීම් නොවී නම් මහ බැංකු මංකොල්ලය පිළිබඳ විමර්ශනයක් සිදුවේයැයි ඔබ සිතන්නෙහිද ? මම අදටත් වූදිතයින් රැකීමේ පිළිවෙතට ප්‍රතිපක්ෂ වන්නෙමි.

## යුක්තිය උදෙසා

අර්ජුන මහේන්ද්‍රන් ආර්ථික ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම මා නොවන්නට සිහිනයක් පමණි. එසේම රවි කරුණානායකට ඇමති ධුරවල රැඳී සිටීමට නොහැකි වූයේ ඔහුට එල්ල වූ චෝදනාවලදී මා විසින් දක්වන ලද ප්‍රතිචාර නිසා නොවේද ? මගේ කැබිනට් සගයින්ට එරෙහිව පියවර ගැනීමට මා පසුබට නොවූ වග ඔබ ඉඳුරා දන්නෙහිය.

මා ක්‍රියා කළේ භගවත්ගීතිකාවේ අර්ජුන ක්‍රියා කළ ආකාරයටම බව සමහරු නොදනිති. තමන්ගේ අසිපතින් කැපෙන්නේ නෑයන් ද, මිතුරන් ද යන්න නොබලා යුක්තිය හා සාධාරණත්වය උදෙසා එය ක්‍රියාත්මක කිරීමට අර්ජුන ක්‍රියා කළ පරිදිම මම ද ක්‍රියා කර ඇත්තෙමි. මාත් අගමැතිවරයාත් ප්‍රතිපත්ති ගරුකව, භේද අවම කර ගෙන එක්ව කටයුතු කරද්දී දෙපක්ෂයේම අය නොයෙක් ගැටුම්වලට මැදි වූ අයුරු ඔබ දන්නෙහිය. නොබෝදා සිදු වූ තවත් එජාප ඇමැතිවරයෙකු ධුරයෙන් ඉවත් කිරීමට මට සිදු විය. එහෙත් සම්මුති ආණ්ඩුව තුළ සිදු වූ ඉවත් කිරීම් දෙකම, එනම් රවි කරුණානායක හා විජයදාස රාජපක්ෂ ඉවත් කළේ දෙයාකාර ක්‍රියාවලියක් නිසා බව ද මම ඔබට කියන්නෙමි. විජයදාස ජනතාවට කියා සිටියේ තමන් අධිකරණයට ඇඟිලි නොගැසීම තම පක්ෂයේම පිරිසකගේ කෝපයට හේතු වූ බවය. කෙසේ හෝ ගෙවී ගිය දෙවසරකට නොඅඩු කාලය මුළුල්ලේම ම විසින් ක්‍රියාකරන ලද්දේ පිරිසිදු පාලනයක් හා විනයක් සහිත දේශපාලනයක් ස්ථාපිත කිරීමේ අරමුණින් බව මා නිහතමානීව කිව යුතුය. මම සිංහල බෞද්ධයෙකු බව කීමට කිසි විටෙක බිය නොවන්නෙමි. එහෙත් මට සිංහල, දෙමළ, මුස්ලිම් වැනි කිසිදු භේදයක් නැත. මා සිතන්නේ අප පළමුව ශ්‍රීලාංකිකයින් බවය. දෙවනුව සිංහල, දෙමළ හා මුස්ලිම් වන බවය. මම විරාගත සම්මතය අනුව මහනාහිමිවරුන්ගේ උපදෙස් අනුශාසනා අගයන්නෙමි.

## ව්‍යාජ දේශප්‍රේමය

එහෙත් සිංහල බෞද්ධ 'පච්චා' කොටාගැනීමට මම කලබල නොවෙමි. දෙමළ ඩයස්පෝරාවෙන් කප්පම් ගත් ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවල රැකඩයක් වීමට ද මට වුවමනා නැත. අප ක්‍රියාකරන්නේ එක රටක් - නොබෙදුණු රටක් යන ප්‍රතිපත්තිය අනුව බව ද මගේ විවේචකයින්ට කිව යුතුය. ජාතිවාදය, ආගම්වාදය මේ රටට කළ විනාශය ඕනෑවටත් වඩා වැඩි බව ශ්‍රීලනිපයේ අප හොඳින් තේරුම් ගත යුතුය.

ශ්‍රීලනිපයේ ආරම්භයේ සිටම දෙමළ හා මුස්ලිම් නායකයින් සමග වූ සහෝදරත්වයට අපි ගරු කළ යුතු වන්නෙමු. පොදු ජනතාව තුළ භීතියක්, සැකයක් ඇති කරමින් බලය ඩැහැගැනීමට කුරුමානම් අල්ලන ව්‍යාජ දේශප්‍රේමයට අපේ පක්ෂය යට විය යුතු නැත. මනුෂ්‍යයාගේ සාධාරණ

හිමිකම, ජාතිය, භාෂාව, ආගම, කුලය, ධනය යන කිසිවකට යට විය යුතු නැති බව මම දැඩි සේ පිළිගනිමි. අපේ බෙදීම, දුරස්වීම නිසා ගෙවී ගිය පාලන කාලය තුළ රටට, ජනතාවට අහිමි වූ දේවල් අප්‍රමාණය. පෞද්ගලික සිත් රිදවීම්වලට වඩා පොදු අරමුණු නිසා ඇතිවන බැඳීම් අපට ශක්තියක් ලබා දෙන බව මම විශ්වාස කරමි.

ශ්‍රීලනිපයට ආවරණය වී වෙනත් දේශපාලනයක නිරත වීමට වඩා සෘජුපම්පන්නව එතැනින් ඇත් වීමට ශක්තියක් තිබෙන අයට මම බාධා නොකරමි. එහෙත් තිරසරව මා සමග එක්ව යන ගමනක ප්‍රාර්ථනා දල්වා ගැනීමට මේ 66 වැනි සංවත්සරයේදී මම සියලු දෙනාට හද පත්ලෙන්ම ඇරියුම් කරමි.

අපේක්ෂා භංගත්වයෙන් පීඩාවට පත් උතුරු නැගෙනහිර ජනතාවගෙන් මා ලද හෘදයාංගම ප්‍රතිචාරය මට මෙන්ම ඔබට හා පක්ෂයට ආඩම්බරයකැයි මම සිතමි. දේශපාලන අන්ධකාරයක රටක් ගිල්වා තැබීමට මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සියලු ජන කොටස් සූදානම් නැති බව මා ලද විජයග්‍රහණයේ සරල හා පැහැදිලි මෙන්ම ගාම්භීර අර්ථයයි. මට එරෙහිව කැරලි ගසන්නෝ ඉතිහාසය ආපස්සට ඇදගෙන යන්නෝ විනා වෙනස් වන සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රවණතාවන් හඳුනා ගන්නෝ යැයි ඔබ සිතන්නෙහිද ? පුද්ගල අභිවාදනය නමැති මායා පටලයෙන් අන්ධ වී යථාර්ථය සැඟවීමට ඉඩ නොදීම මේ තීරණාත්මක අවස්ථාවේදී සැබෑ ශ්‍රීලනිප පාක්ෂිකයින්ගේ වගකීම බව මම ඉඳුරා කියන්නෙමි.

අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ අපට සාධනීය ප්‍රතිචාරයක් දැක්විය හැකිය. පවතින ව්‍යවස්ථාවට එකඟ නොවූ මෙන්ම, එයට අත නොඔසවූ අයෙකු ලෙස එහි අඩුපාඩු තියුණු ලෙස වටහා ගැනීමට මට හැකිය. රටට අවශ්‍ය දේ කිරීම අපගේ අධිෂ්ඨානය විය යුතුය. අපගේ සම්ප්‍රදායන්, උරුමයන් සුරකිමින්, බුදු දහමට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතුය යන තිරසාර පදනම අප විසින් අපට පනවා ගත යුතු ප්‍රතිපත්තිය බව මම නිසැකවම දනිමි. මේ රටේ සියලු ජන කොටස් සාධාරණව එක්සත්ව ක්‍රියා කිරීමට සූදානම් බව මගේ විජයග්‍රහණයෙන් තහවුරු කර තිබෙන යථාර්ථයයි.

## නව දේශපාලන සංස්කෘතියක්

1951 සැප්තැම්බර් 03 වැනිදා මා මෙලොව එළිය දුටු මොහොත වනාහී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි වීමට පමණක් නොව, අභිනව දේශපාලන සංස්කෘතියක සමාරම්භයක් ද වීම හැම අතින්ම මගේ මවිතයට හේතු වන්නකි. ශ්‍රී ලංකාවේ සතර දෙසින් එක්ව සිටින අපගේ 66 වැනි සංවත්සර සභාව මා දකින්නේ හාස්කමක් මෙන්ම ශ්‍රී ලංකා මාතාවටත්, රට වෙනුවෙන් මෙන්ම පක්ෂය වෙනුවෙන් දිවි දුන් සියලු දෙනාටත් පුද කරන ගෞරවයක්, විශිෂ්ට උපහාරයක් ලෙසය. ඒ සේවය රටට ලබාදීමට එක්සත්ව, එක්සිත්ව ක්‍රියා කිරීමට ඉතිහාසය අපට බලකර සිටියි. ශ්‍රී ලංකාවේ බරපතළ ජාතික ප්‍රශ්නය විසඳා ජාතිය එක්සත් කිරීමේ ස්වර්ණමය අවස්ථාවට අපේ පක්ෂය එළඹ සිටියි.

[illegible] කලාපයේ [illegible] දිවයිනක් වුවත් [illegible] සිටින්නේ අපේක්ෂා [illegible] පත් වූ දුක්ඛිත [illegible] අපට අවංකවම උදව් [illegible] හැකිද ? මා අපේක්ෂා [illegible] පොදු ජනතාවගේ [illegible] අනුග්‍රහය සහ ඔබගේ [illegible] අභිමානයෙන් ආශීර්වාදය ඇතිව ශ්‍රී ලංකා මාතාවටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අපගේ ගරු [illegible] ගෙවීමට බව ද සඳහන් කරනු කැමැත්තෙමි. ඒ ජාතික මෙහෙයුමේ සැබෑ සංග්‍රාහකයින් වීමට මම මේ මොහොතේ ඔබ සැමට ඇරියුම් කර සිටින්නේ ඔබේ නායකයා, රාජ්‍ය නායකයා වශයෙන් නොව, ඔබත් මාත් බැඳී සිටින උතුම් අරමුණු උදෙසා කැපවීමේ නිහතමානී ජනතා සේවකයෙකු ලෙස බව ද සඳහන් කළ යුතුය.

ඔබ සැමට තෙරුවන් සරණයි.

පෙරදිග අහස මුදු හිරු සේ පිපෙමි මම

දුරලන අඳුර එළියක් සේ අඳෙමි මම

සරනැස නිවන පවනක් සේ රැඳෙමි මම

මොරගහකන්ද දියවර සේ ගලමි මම

මා - ඔබේ මහජන සේවක

මෛත්‍රීපාල සිරිසේන

ඉදිරිපත් කිරීම :
සුමේධ ජයබාහු
උපුටා ගැනීම : 2017 /08/ 27/
සිළුමිණ, පිටුව 04





# ජාතික සංහිඳියාවට මෛත්‍රී ප්‍රවේශයක්

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගිය 20 වැනිදා, ලංකාවේ වේලාවෙන් නම් අළුයම එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 72 වැනි සැසිවාරය ඇමතුවා. දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කළ ආකාරයම එක්සත් ජාතීන්ගේ රාජ්‍ය නායක සමුළුව ආරම්භයේදීම එය අමතන්න් ලැබීම රාජ්‍ය නායකයෙකුට ලැබෙන සුවිශේෂ අවස්ථාවක්.

ගෝලීය දේශපාලනයේ බලපුළුවන්කාර රාජ්‍යයක් නොවන ලංකාව වැනි රටක රාජ්‍ය නායකයෙකුට මෙවැනි අවස්ථාවක් ලැබීම අතිශයින් දුර්ලභ එකක් බව ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා ප්‍රකාශ කළා. එහිදී ඔවුන් අවධාරණය කළේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා පසුගිය කෙටි කාලය තුළ ප්‍රකට කළ ප්‍රජාතන්ත්‍රවාදී හා සංහිඳියාත්මක භාවිතය මෙම සුවිශේෂ අවස්ථාවට හිමිකම් කීමට අවස්ථාව උදාකර දුන් බවයි.

"තිරසර ලොවක් මත සෑම මිනිසෙකුටම වැදගත් ජීවිතය සහ සාමය සඳහා ප්‍රයත්නය" යන තේමාව යටතේ පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ 72 වැනි සැසිවාරය ලංකාවට මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට ද අතිශයින් වැදගත් වෙනවා. ඒ කාරණා කිහිපයක් නිසා: එයින් ගෝලීය වශයෙන් ප්‍රමුඛ වන්නේ උතුරු කොරියානු න්‍යෂ්ටික අර්බුදය සමග ගෝලීය දේශපාලනය එක්වරම උණුසුම් ස්වභාවයක් ගැනීම. ඒ වගේම ගෝලීය වශයෙන් ඇතිව තිබෙන දේශගුණික විපර්යාසවල

"ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා මෙවර එක්සත් ජාතීන් හමුවට ගියේ මහත් අභිමානයෙන් බවයි පෙනී යන්නේ. ඒ අභිමානයට හේතුව වුණේ තමන් දුන් පොරොන්දු ඉටු කළ නායකයෙකු වශයෙන් ජනපතිවරයා තුළ ඇති වූ අභිමානයයි"

ක්‍ෂණාත්මක බලපෑම අතිශයින් ප්‍රබල ආකාරයෙන් දැනෙන්නට පටන් ගෙන තිබෙනවා. මේ බව මනාව පැහැදිලි කරමින් ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ කැරිබියන් කලාපය පසුගිය සති කිහිපය තුළ දමැන්ත සුළි කුණාටු දෙකකින් නොසැහෙන්න බැට කෑවා. ලංකාවෙත් වියළි කලාපයේ දැඩි නියං තත්ත්වය සහ තෙත් කලාපයේ අධික වර්ෂාව මේ දේශගුණික විපර්යාසවල ඍජු ප්‍රතිඵල වශයෙන් සැලකිය හැකියි.

ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහා සමුළුව වැදගත් වන්නේ පසුගිය ආණ්ඩුව සමයේ ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව තුළ පැවැති සෘණාත්මක හා කෝන් කිරීමේ ආකල්පය වේගයෙන් වෙනස් වෙමින් පවතින වාතාවරණයක් තුළ, ඒ වෙනසට නායකත්වය දෙමින් සිටින රාජ්‍ය නායකයාට තමන් ගත් මග හා ඒ මග දිගට හමුවන අභියෝග හා ගැටලු ගැන ජාත්‍යන්තර ප්‍රජාවම එකවර දැනුම්වත් කරමින් සංවාදයේ යෙදීම පහසු අවස්ථාවක් නිර්මාණය වීම නිසයි. සමුළුව ආරම්භයේදීම ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාට තම දේශනය පැවැත්වීමට අවස්ථාව ලැබීම ජාත්‍යන්තර මාධ්‍යවල දැඩි ඇගයීමට ලක් වුණේ මේ තත්ත්වය නිසයි.

## ජාත්‍යන්තර ඉදිරියේ අභිමානයෙන්

ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා මෙවර එක්සත් ජාතීන් හමුවට ගියේ මහත් අභිමානයෙන් බවයි පෙනී යන්නේ. ඒ අභිමානයට හේතුව වුණේ, තමන් දුන් පොරොන්දු ඉටු කළ නායකයෙකු වශයෙන් ජනපතිවරයා තුළ ඇති වූ අභිමානයයි. විශේෂයෙන් විධායක බලතල කප්පාදු කිරීම, රට තුළ නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීම, ජාතික සංහිඳියාව ගොඩනැගීම සහ පරිසරය සම්බන්ධයෙන් වඩාත් තිරසාර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කළ 'සහශ්‍ර සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නිර්මාණය කිරීම, මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම යන තම වර්ණවත් යහපාලන පොරොන්දු ජනපතිවරයා විසින් පසුගිය කාලය තුළ සාර්ථක ආකාරයෙන් ඉටු කර තිබුණා. තමා ලබාගත් මේ ජයග්‍රහණ ගැන ජනපතිවරයා තම දේශනය ආරම්භයේදීම සඳහන් කිරීමට අමතක කළේ නැහැ.

"2015 වසරේ ජනවාරි මාසයේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ලෙස පත්වූ මා එසේ පත්වීමට පෙර මගේ රටේ ආදරණීය ජනතාවට මා දුන් පොරොන්දු කිහිපයක් තිබෙනවා. එහිදී විශේෂයෙන් මා සඳහන් කළේ ලෝකයේ කිසියම් රටක, කිසියම් නායකයෙකුට නොතිබූ අසීමිත බලයක් ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයාට තිබූ බැවින් මා බලයට පත්වූ විට ඒ අසීමිත බලය ජනාධිපති ධුරයෙන් ඉවත් කර පාර්ලිමේන්තුව සඳහා පවරනු ලබන බවයි. බලයට පත්වූ නායකයෙක් එවැනි අසීමිත බලතල රාශියක් සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, තනතුර තුළ තිබියදී එම බලය, බලයේ සිටින අවස්ථාවේ තමා විසින්ම අත්හළ, පාර්ලිමේන්තුවට පැවරූ නායකයෙක් විදියට මුගේ රටේ ජාතික දේශපාලනයටත්, ජාත්‍යන්තර දේශපාලනයටත් බලය අත්හැරීම පිළිබඳ ආදර්ශය මා විසින් දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය සුරකින පෝෂණය කරන රටවල් ලෙස ප්‍රධාන වශයෙන්ම බලයට පත්වන නායකයෙක් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමත් බලය නිසි ලෙස භාවිතා කිරීමත් සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා සිය බලය භාවිතා කිරීමත් ඉතා වැදගත් වෙනවා. නමුත් ගෙවී ගිය දශක කිහිපයත්, ලෝක ඉතිහාසයත් ගත්විට පෙනී යන්නේ බලයට පත්වන බොහෝ නායකයින්, බලයෙන් ඉවත්වීමට තිබෙන්නා වූ අකමැත්ත තුළ, එම රට තුළ සාමය බිඳීම, සාමය නැතිවීම මෙන්ම එය ජාත්‍යන්තර වශයෙන් ද විවිධ බෙදීම් අසමගිකම් සඳහා බලපාන බවයි. එවැනි ඓතිහාසික සිද්ධාන්ත, තොරතුරු පිළිබඳ ජාතික වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් අපට අවබෝධයන් රාශියක් තිබෙනවා. මේ සියලු තත්ත්වයන් තුළ මගේ රටේ ප්‍රජාතන්ත්‍රවාද තහවුරු කරමින්, ආශ්වාදායක ගමනක් ගිය, තනි බලයක් පාවිච්චි කරමින් අසීමිත බලයක් ගෙන ගිය දේශපාලන කණ්ඩායම් ඉවත් කර, රට තුළ ජනතාවගේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරමින් මානව හිමිකම් ආරක්ෂා කරමින්, මූලික අයිතිවාසිකම් පෝෂණය කරමින් ගෙවී ගිය වසර දෙක හමාරක කාල සීමාව තුළ මා සාර්ථක ගමනක් පැමිණි බව විශේෂයෙන් මේ ගෞරවනීය උත්තරීතර සභාවට ප්‍රකාශ කරන්න ඕන"

ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා බලයට පත් වූ මොහොතේ ජාත්‍යන්තරයට දුන් සහතිකය වුණේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරමින්, මානව හිමිකම් සුරක්ෂිත කරමින් ජාතික සංහිඳියාව ගොඩනැගීම සඳහා පියවර ගන්නා බවයි. ජනපතිවරයා ජාත්‍යන්තරයට දුන් මෙම සහතිකය ද පසුගිය වසර දෙක්හමාරට ආසන්න කාලය තුළ ජාත්‍යන්තරයට පිළිගත හැකි හා විශ්වාස කළ හැකි මට්ටමකින් ඉටු කිරීමට ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමත් වුණා. පසුගිය ජිනීවා මානව හිමිකම් සමුළුවට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කිසිදු යෝජනාවක් ඉදිරිපත් නොවීම සහ එක්සත් ජාතීන්ගේ සමුළුව තුළ ජනපතිවරයාට ලැබුණු සුවිශේෂ පිළිගැනීම මේ පොරොන්දුව ජාත්‍යන්තරයේ

ඇගයීමට ලක්ව ඇති ආකාරයට පැහැදිලි සාධකයක් වුණා.

## සංහිඳියාව ගැන ජනපති දැක්ම

දේශීය හා ජාත්‍යන්තර දේශපාලන විශ්ලේෂකයින්ට අනුව ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ දේශනයේ වඩාත්ම අවධාරණාත්මක හා ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ සනාථ කළ යුතුව තිබූ කරුණ වන්නේ ජාතික සංහිඳියාව සම්බන්ධයෙන් ජනපතිවරයා දැක්වූ ප්‍රායෝගික හා අවංක ප්‍රවේශයයි. මෙය රටේ වත්මන් ප්‍රවණතා සහ රජයේ හැකියාව මනාව විශ්ලේෂණය කරමින් කළ ප්‍රායෝගික ඇගයීමක් බව ඔවුන් ප්‍රකාශ කරනවා. ජාතික සංහිඳියාව ගොඩනැගීමේ තම ප්‍රවේශය පැහැදිලි කරමින් ජනාධිපතිවරයා මෙසේ ප්‍රකාශ කළා.

"ඇතැම් අන්තවාදී පිරිස් වේගවත් ගමනක් බලාපොරොත්තු වෙනවා. ඇතැම් අන්තවාදී පිරිස් කඩිනම් විසඳුම් බලාපොරොත්තු වෙනවා. නමුත් වසර 30කට ආසන්න කාලයක් යුද්ධයක් පැවති රටක් විදියට, බෙදීම් තිබුණ රටක් විදියට රට තුළ ජනතාවගේ සමගිය ඇති කරලා ඒ සමගිය තුළ සහෝදරත්වය ගොඩනගලා මගේ ආදරණීය රටත් ජනතාවත් ගොඩනගන්නට, ශක්තිමත් කරන්නට ඔබ සියලු දෙනාගේම සහය ඉල්ලා සිටිනවා. ඒ නිසයි මා මෙහිදී ඉතා පැහැදිලිව කියන්නේ සෙමින් යන සාර්ථක ගමනක් සඳහා අපිට අවශ්‍ය සහයෝගය දෙන්න කියලා. වේගවත් ගමනක් අනතුරු සහිතයි කියලා අපි සැවොම අහලා තියෙනවා. ඒ නිසා ඇතැම් අන්තවාදී පිරිස් බලාපොරොත්තු වන වේගවත්, කඩිනම් විසඳුම් දීමේ අසීරුතාවන් මුළු මහත් සමාජය තුළ තිබෙන්නා වූ සංකීර්ණ ස්වභාවයන් ඔබ සැම කෙනෙක්ම [illegible] විශ්වාස කරනවා. ඒ නිසා [illegible] රට තුළ නැවත යුද්ධයක් ඇති නොවන්නට, සියලු ජාතීන් තුළ සමගියක් ඇති කරන්නට මගේ රජය ගෙනයන වැඩපිළිවෙළට එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු සියලු රාජ්‍යවල සහයත් මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා."

## වේගවත් ගමනක් බැරි ඇයි ?

ලංකාවේ ජනවාර්ගික ගැටලුවට විසඳුම් සෙවීමේ ප්‍රයත්නයේදී පසුගිය කාලය පුරා පාලකයින් විසින් මුහුණ දුන් සංකීර්ණම ගැටලුව වූයේ උතුරේ සහ දකුණේ ජනවාර්ගික අභිලාෂයන්ගේ අති සංකීර්ණභාවයයි. උතුර තෘප්තිමත් වන විසඳුමකට දකුණත්, දකුණ තෘප්තිමත් වන විසඳුමකට උතුරත් විරුද්ධ වීම පසුගිය කාලය පුරාම සිදු වූ පොදු තත්ත්වය බවට පත් වුණා. මෙය බණ්ඩාරනායක- චෙල්වනායගම්, ඩඩ්ලි- චෙල්වනායගම්, තිම්පු සාකච්ඡා, ඉන්දු - ලංකා ගිවිසුම, පමණක් චන්ද්‍රිකා බණ්ඩාරනායක යුගයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,



එස්. ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සහ චෙල්වනායගම් මහතා

වශයෙන් ජනවාර්ගික ගැටලුවට විසඳුමක් සෙවීමට ආණ්ඩුව ගත් සියලු ප්‍රයත්නයන් අසාර්ථකභාවයට පත් කිරීමට [illegible] [illegible] [illegible] ආයාසයකින් [illegible] වුණා.

අද ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා සෘජුව මුහුණදී සිටින්නේ මේ ඓතිහාසික අභියෝගය. ජනවාර්ගික අභිලාෂයන්ගේ ධ්‍රැවීකරණය ජය ගැනීමේ අභියෝගයකට. මේ අභියෝග හා සංකීර්ණතා ඇති කළේ සිංහල හෝ දෙමළ සාමාන්‍ය පොදු ජනතාව නොව දෙපාර්ශ්වයේම අන්තවාදීන් විසින් බව ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගිය කාලය තුළත් වත්මන් දේශපාලන තත්ත්වය තුළත් මනාව වටහා ගෙන සිටිනවා.

මේ තත්ත්වය ජනපතිවරයා විසින් ම මුහුණදී විසඳා ගත යුතු වත්මන් තත්ත්වය තුළින්ම පැහැදිලි කරගත හැකියි. උදාහරණයක් ලෙස ලංකාවේ ජාතික තලයේ කෘතහස්ත දමිළ දේශපාලන නායකයින් වශයෙන් සැලකෙන, ආර්. සම්බන්ධන්, සුමන්තිරන් ආදී නායකයින් ද, මනෝ ගනේෂන් වැනි තරුණ ක්‍රියාකරද්දී, උතුරු පළාත් මහ ඇමැති විග්නේශ්වරන් වැනි අන්තවාදීන් කිහිප දෙනෙක් ඒ මධ්‍යස්ථ හා ප්‍රායෝගික


ප්‍රවේශයට අභියෝග කරමින් ක්‍රියාකරනවා. කඩිනම් විසඳුම් ලබා දෙන් මෙන් බල කරමින් සිටිනවා. මේ තත්ත්වය දකුණෙන් ඒ ආකාරයෙන්ම සිදු වෙනවා. උතුරට ලබා දෙන දේශපාලන් විසඳුමට බාධාකාරීව හැසිරෙන්නේ ජන පදනමක් ඇති ජාතික තලයේ දේශපාලනඥයින් වෙනුවට කිසිඳු ආකාරයක ජන පදනමක් නැති විමල් වීරවංශ, දිනේෂ් ගුණවර්ධන වැනි මාධ්‍ය ප්‍රතිරූපක පමණයි.

මේ තත්ත්වය තුළ දෙපාර්ශ්වයේම අන්තවාදීන් පිනවීම සඳහා කඩිනම් විසඳුම් හෝ වේගවත් ගමනක් අනවශ්‍ය ගැටලු ඇති කරන්නක් බවයි ජනතිවරයාගෙ අදහස වන්නේ. එය ජනපතිවරයා පසුගිය වසර දෙකහමාරකට ආසන්න තම පාලන කාලය තුළ ලබාගත් අත්දැකීම් මගින් වඩාත් ප්‍රායෝගිකව පසක් කර ගෙන ඇති බවයි අපට පෙනී යන්නේ.

## අන්තවාදී ජාත්‍යන්තරය

ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියාව ගොඩනැගීමේ ක්‍රියාවලිය රට අභ්‍යන්තර කාර්යයකින් ඔබ්බට පසුගිය කාලයේ ගමන් කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජිනීවා මානව හිමිකම් සමුළුව ආදී ජාත්‍යන්තර වේදිකාවන්ට මේ ගැටලුව ගියේ පසුගිය ආණ්ඩුව අනුගමනය කළ අන්තවාදී සහ අවස්ථාවාදී ප්‍රවේශයන් නිසා බව පැහැදිලියි. එහෙත් ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා බලයට පත් වූ පසු මධ්‍යස්ථ ජාත්‍යන්තරය ශ්‍රී ලංකාවේ සංහිඳියාව ගොඩනැගීමේ කාර්යයට වන මැදිහත්වීම ක්‍රමයෙන් සීමා කරමින් සිටිනවා. ඒ ජනපතිවරයා පසුගිය කෙටි කාලය තුළ අනුගමනය කළ ක්‍රියාමාර්ග ඔවුන්ගේ විශ්වාසයට හා ඇගයීමට ලක්ව තිබෙන නිසයි. විශේෂයෙන් එක්සත් ජාතීන් සහ මානව හිමිකම් කොමිසම; ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර ප්‍රජාව මේ සම්බන්ධයෙන් වර්තමානයේ දක්වන්නේ ධනාත්මක සහ සහනශීලී ආකල්පයක්. එහෙත් ඇතැම් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන තම දේශපාලනික හා මූල්‍ය න්‍යාය පත්‍ර අනුව තවමත් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන්, කඩිනම් සහ අන්තවාදී ප්‍රවේශයන් අපේක්ෂා කරන ආකාරයක් දැකිය හැකියි. ඔවුන් ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගේ දේශපාලන අභිලාෂයයන් වෙනුවට දෙමළ ඩයස්පෝරාවේ අභිලාෂයන් නියෝජනය කිරීම මේ සඳහා හේතු වන බව පැහැදිලියි.

ඔවුන්ගේ අනුබලය සහ මූල්‍යාධාර ලබමින් පෝෂණය වන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන ද මේ ඊනියා කඩිනම් විසඳුම් අපේක්ෂා කිරීම වත්මන් සංහිඳියා ප්‍රයත්නයට රැකුලක් වනවා වෙනුවට උතුරේ හා දකුණේ අන්තවාදීන්ට අවි සපයා දීමක් වෙලා තිබෙනවා.



ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ මැතිණිය ඇමෙරිකානු ජනාධිපතිතුමා සහ මැතිණිය සමග

ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා මේ තත්ත්වය මනාව හඳුනා ගෙන තිබෙන බව එක්සත් ජාතීන් හමුවේ කළ දේශනය තුළින් පැහැදිලි වෙනවා.

''වේගවත් ගමනක් අනතුරු සහිතයි කියලා අපි සැවොම අහලා තියෙනවා. ඒ නිසා ඇතැම් අන්තවාදී පිරිස් බලාපොරොත්තු වන වේගවත්, කඩිනම් විසඳුම් දීමේ අසීරුතාවන් මුළු මහත් සමාජය තුළ තිබෙන්නා වූ සංකීර්ණ ස්වභාවයන් ඔබ සැම කෙනෙක්ම පිළිගනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ නිසා මගේ රට තුළ නැවත යුද්ධයක් ඇති නොවන්නට, සියලු ජාතීන් තුළ සමගියක් ඇති කරන්නට මගේ රජය ගෙනයන වැඩපිළිවෙළට එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු සියලු රාජ්‍යවල සහයත් මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා''ජනපතිවරයා එක්සත් ජාතීන්ගෙන් ඉල්ලා සිටිනවා. මෙයින් අපට ඉතාම පැහැදිලිව පෙනී යන්නේ දේශීය අන්තවාදය පමණක් නොව ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියාවට හානිකර ජාත්‍යන්තර සංවිධානවල සහ රාජ්‍යයන්ගේ අන්තවාදය පවා ජනපතිවරයා විසින් තරයේ ප්‍රතික්ෂේප කරමින් වඩාත් තිරසාර විසඳුමක් වෙනුවෙන් වන යහපාලන ප්‍රවේශයට ජාත්‍යන්තරයේ අනුබලය හා පිටුබලය අපේක්ෂා කරන බවයි.

## මෛත්‍රී ප්‍රවේශයක්

මේ ප්‍රශ්නය බොහෝ දෙනෙක් තුළ තිබෙනවා. මෙම ලේඛකයාගේ අදහස වන්නේ අන්තවාදීන් පිනවන කඩිනම් විසඳුම් ලබාදීම ප්‍රතික්ෂේප කරමින් අදාළ සංකීර්ණතා සහ ප්‍රවණතා ගැන මනා වැටහීමක් සමගින් ජනපතිවරයා ගමන් කරන තිරසර ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියාව ගොඩනැගීමේ ප්‍රයත්නයට ඵලදායී පිළිතුරක් වනු ඇති බවයි. මේ තත්ත්වය අපට ඉතා පහසුවෙන් වටහා ගත හැකියි.

ජනවාරි 08 විජයග්‍රහණයෙන් පසු උතුරේ ජනතාව වෙනුවෙන් ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා අනුගමනය කළ මැදිහත් ප්‍රවේශය දකුණේ අන්තවාදීන් ප්‍රකෝප කිරීමට හේතු වනු ඇතැයි බොහෝ දෙනෙක් අපේක්ෂා කළා. ඔවුන් විශ්වාස කළේ උතුරු නැගෙනහිර හමුදා කඳවුරු ඉවත් කිරීම; හමුදාව ඉවත් කිරීම; අධි ආරක්ෂිත කලාපවල ඉඩම් කඩිනමින් පවරාදීම, බලය බෙදා හැරීම සඳහා කඩිනම් විසඳුම් ඉදිරිපත් කිරීම, මානව හිමිකම් කොමිෂමේ යෝජනා අනුව යමින් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම ආදිය කඩිනමින් සිදුවනු ඇති බවයි.

එහෙත් මේ බොහෝ ඉල්ලීම් ජාත්‍යන්තර සහ දේශීය අන්තවාදීන්ගේ ඉල්ලීම් සහ න්‍යාය පත්‍ර බව ජනපතිවරයා වටහා ගෙන තිබූ නිසා ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා අනුගමනය කළේ ප්‍රථමයෙන්ම දමිළ ජනතාවගේ සහ ජාතික තලයේ දමිළ නායකයින්ගේ විශ්වාසය දිනා ගන්නා ප්‍රවේශයක් මිස අන්තවාදීන් පිනවන ප්‍රවේශයක් නොවෙයි. දමිළ ජාතික සන්ධාන නායකයා විපක්ෂ නායකා වන්නේත්,

උතුරු පළාත් [illegible] ජාතික ගැටලුව ගැන වඩාත් සංවේදී රෙජිනෝල්ඩ් කුරේ මහතා පත්වුණේත් මේ සංහිඳියාත්මක ප්‍රවේශය මතයි. අද උතුරේ අධි ආරක්ෂිත කලාපවල ඉඩම් යළි ක්‍රමයෙන් ජනතාව පවරා දෙන විධිමත් ප්‍රවේශයක් ක්‍රියාත්මක වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය, අතුරුදන්වූවන්ගේ ලේකම් කාර්යාලය වැනි නෛතික ක්‍රියාවලියත් ක්‍රමිකව ඉදිරියට ගමින් තිබෙනවා.

අන්තවාදීන් සහ අවස්ථාවාදීන් පිනවීමකින් තොරව පොදු ජනතාවගේ අභිලාෂයන් ඉටු කිරීම පමණක් ඉලක්ක කරගත් මේ සංහිඳියාත්මක ප්‍රවේශය හෙට දවසේ තිරසර විසඳුමක් වනු ඇත්තේ මේ හෙමින් යන ගමන තුළයි. පසුගිය දා මුළුමහත් ලෝකය හමුවේ ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා හෙළි කළේ මේ යහපාලන ප්‍රවේශය මිස අන්තවාදීන් පිනවන 'මැදමුලන පන්නය' නොවන බව අවධාරණය කළ යුතුයි.

සටහන
භාතිය බරුකන්ද



දමිළ නායකයින් ද දකුණේ සිංහල ජනතාවගේ දේශපාලන හැඟීම් හා මනා අවබෝධයකින් ක්‍රියාකරද්දී උතුරු පළාත් මහ ඇමැති විග්නේශ්වරන් වැනි අන්තවාදීන් කිහිප දෙනෙක් ඒ මධ්‍යස්ථ හා ප්‍රායෝගික ප්‍රවේශයට අභියෝග කරමින් ක්‍රියාකරනවා. කඩිනම් විසඳුම් ලබා දෙන මෙන් බල කරමින් සිටිනවා.